2010.01.07 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2001.01.25 සහ 2006.05.31 දිනැති සහ පිළිවෙලින් අංක 314 සහ 1579 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අම්බලන්ගොඩ ලියනගේ සුරංග සහ ඇරදෙන සාවිත්‍රි කුරුප්පු යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්තුන්ලක්ෂ පනස්දහස් තුන්සිය හතලිහයි ශත අසූඑක (රු. 33,50,340.81) ක මුදලක් 2009.09.05 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 33,50,340.81ක මුදලට 2009.09.06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 314 සහ 1579 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්ගම්පෙරුව කොටසේ බෝගමුව අලුත්ගම, නුවර පාරේ, වරිපනම් අංක 336/3හි "ගල්ගෙඩියන" නොහොත් "මීගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඒ. ඒ. ඩබ්. කාවල්හේ විසින් ලියා සහතික කරන ලද 2000.05.07 දිනැති අංක 1115 දරන පිඹුරේ ලොට් අංක බී4 දරන ඉඩමට මායිම් වන උතුරට : පිඹුරු අංක 971හි ලොට් අංක බී2, බී3 සහ පිඹුරු අංක 894හි ලොට් අංක සී වලින් ද, නැගෙනහිරට : ලොට් අංක සී වලින් ද, දකුණට : ඇලෙන් සහ ලොට් අංක ඒ වලින් ද, සහ බස්නාහිරට : ලොට් අංක ඒ වලින් ද මායිම් වූ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් පහයි දශම හතරයි බින්දුව (අ. 1, රූ. 1, පර්. 5.40) ක් විශාල ඉඩම සහ සියලු දේත් සමග වේ.

අංක 314 සහ 1579 දරන උකස් බැඳුම්කරවල දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-470/10

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - මොණරාගල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රත්නායක මුදියන්සේලාගේ ධර්මපාල සහ සෙනරත් බණ්ඩාර රත්නායක.

2010.01.07 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 1999.04.22 දරන හා අංක 6693 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්නායක මුදියන්සේලාගේ ධර්මපාල සහ සෙනරත් බණ්ඩාර රත්නායක යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ අසූනමදහස් අටසිය පනස්අටයි ශත පනස්එක (රු. 5,89,858.51) ක මුදලක් 2009.09.30 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,89,858.51ක මුදලට 2009.10.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 6693 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැදිරට කෝරළයේ, බුත්තල එතින්ඔලේ කොලනියේ, ඉඩම් අංක 107 පිහිටි ඉඩමට සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද අංක 79 පිඹුරෙහි ලොට් අංක 05 දරන කොටසට වන උතුරට : ලොට් අංක 2 පාරෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 07න් ද, දකුණට : ඉඩම් අංක 4 සහ 6න් ද සහ බස්නාහිරට : ඉඩම් අංක 03න් ද මායිම් වූ අක්කර දෙකයි, රූඩ් දෙකයි, පර්චස් දොලහ (අ. 2, රූ. 2, පර්. 12)ක් විශාල ඉඩම වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්.ඩී.ඕ/ආර්3/61 යටතේ ලියාපදිංචි කරන ලදී.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-470/9

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - හල්ස්ඩ්‍රොප් ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මහේෂි සමන්තිකා ත්‍රිකාවෙල.

2010.01.07 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එන්. වික්‍රම විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.05.25 දිනැති අංක 383 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහේෂි සමන්තිකා ත්‍රිකාවෙල යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැදුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ හැටතුන්දහස් අටසිය හැත්තෑහයයි ශත පනස් අට (රු. 7,63,876.58) ක මුදලක් 2009.09.25 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 7,63,876.58ක මුදලට 2009.09.26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 383 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවේ (ගලහිටියාව ඒකකය) ගනේමුල්ල ගමේ පිහිටි ලාවුලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. බී. ජයසේකර විසින් මැන සාදන ලද 2006.01.31 දිනැති අංක 14781 දරන පිඹුරේ ලොට් අංක 1 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : රණසිංහ පාරෙන් ද (ආර්. ඩී. ඒ.), නැගෙනහිරට : ආර්. එම්. ජයමාන්නගේ ඉඩමෙන් ද, දකුණට : දුනුවිලගේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : ඩී. ජී. නිස්සංක සහ එච්. ඒ. ඩී. එස්. ජයරත්නගේ ඉඩම් වලින් ද මායිම් වූ එකී අංක 14781 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහහතරයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 14.5) ක් විශාල ඉඩම වේ.

එකී අංක 14781 දරන පිඹුරේ ලොට් 1 බලයලත් මානක කේ. ඒ. ජී. අමරසිංහ පිළියෙල කරන ලද 1989.10.17 දිනැති අංක 5771 දරන පිඹුරේ ලොට් 1හි නැවත මැණුමක් වන අතර එය ද අංක 2576 දරන පිඹුරේ ලොට් 1හි නැවත මැණුමක් වන අතර එය සවිස්තරව පහත පරිදි වේ.

එකී ගනේමුල්ල ගමේ පිහිටි ලාවුලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ජේ. ඩී. සිල්වා විසින් මැන සාදන ලද 1990.02.09 දිනැති අංක 2576 දරන පිඹුරේ ලොට් අංක 1 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : රණසිංහ පාරෙන් ද (ආර්. ඩී. ඒ), නැගෙනහිරට එකී අංක 5771 පිඹුරේ හි ලොට් බී වලින් ද, දකුණට : ලොට් 4න් ද සහ බස්නාහිරට :

ඩී. ජී. නිස්සංකගේ ඉඩමෙන් සහ කේ. ඒ. කුමාරසේනගේ උරුමකරුවන්ට අයිති ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 2576 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15) ක් විශාල ඉඩම වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 500/36 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-470/8

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ගම්පොල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2010.01.07 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.12.22 වැනි දින දරන සහ අංක 1039 දරන බැඳුම්කරය යටතේ පහත උපලේඛනයේ සඳහන් දේපළ පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ නිශාන්ත අජිත් ලියනගේ උකස්කරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් එකී දේපළ පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත දෙන ලද ණය සඳහා සුරුකුමක් වශයෙන් උකස්කර බැඳ තබන ලද බවත්,

ඉහත සඳහන් නිශාන්ත අජිත් ලියනගේ යන අය, එකී පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කොටස් සියල්ලම පාහේ දැරීම නිසා සහ පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමටඩ් සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණය දරන නිසාත් එකී පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යාථ අයිතිකරු සහ පාලනය දරන තැනැත්තන් වන එකී නිශාන්ත අජිත් ලියනගේ යන අය ඒ අනුව, එකී පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සීමාසහිත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුව ප්‍රදානය කළ මූල්‍ය පිළිසරණවල අත්‍යාථ ප්‍රතිලාභී වන හෙයින් ද,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු ඉතිරි මුදල් ආපසු ගෙවීම ඉහත සඳහන් පී. ඇන්ඩ් එස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නිශාන්ත අජිත් ලියනගේ යන අයවළුන් පැහැර හැර ඇති හෙයින් සහ 2009.05.29 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහතරලක්ෂ පනස්හතරදහස් දෙසිය හැත්තෑහයයි ශත පනහ (රු. 24,54,276.50) ක මුදල සහ ඒ සඳහා 2009.05.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1039 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අදිකාරි පත්තුවේ, මහර ගම්සභා සීමාව තුළ මහර, සූරියපාළුව හි පිහිටි පැලෙන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. සෙනවිරත්න විසින් ලියා සහතික කරන ලද 1980.06.26 දිනැති අංක 2755 දරන පිඹුරේ ලොට් අංක 25 ඉඩමට මායිම්, උතුරට : ලොට් 30න් ද, නැගෙනහිරට : ලොට් 26න් ද, දකුණට : ලුවිස් අප්පුට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : ලොට් 24 මායිම් වූ පර්චස් දහඅටයි දශම පහ (අ. 0, රූ, 0, පර්. 18.5) ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, සහ සියළු දේත් සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 574/98 වෙළුමේ/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම නැවත මැනීමකට අනුව පහත පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, මහර ගම්සභා සීමාව තුළ මහර, සූරියපාළුව ගමේ පිහිටි පැලෙන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් ලියා සහතික කරනලද 1995.02.19 දිනැති අංක 39/1995 දරන පිඹුරේ ලොට් ඒ ඉඩමට මායිම්, උතුරට : අංක 2755හි ලොට් 30 (අඩි 20 පළල පාර)න් ද, නැගෙනහිරට : අංක 2755හි ලොට් 26න් ද, දකුණට : ලුවිස් අප්පු විසින් මීන්පෙර හිමිකම් කියන ලද ඉඩමෙන් සහ බස්නාහිරට : අංක 2755හි ලොට් 24න් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම දෙකයිපහ (අ. 0, රූ. 0, පර්. 18.25) ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ සියළු දේත් සමග වේ.

අංක 1039 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-470/7

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ඇල්පිටිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වික්‍රම ආරච්චි ගුණවර්ධනලාගේ සමන්ත ගුණවර්ධන.

2009.10.28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. මහගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2005.02.10 දින අංක 4833 සහ 2005.11.22 වැනි දින අංක 5081 (පහත පළවන උපලේඛනයේ විස්තර කර ඇති පරිදි) සහ ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. මහගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2005.11.22 වැනි දින අංක 5080 (පහත දෙවැනි උපලේඛනයේ විස්තර කර ඇති පරිදි) දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චි ගුණවර්ධනලාගේ සමන්ත ගුණවර්ධන ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස් නවලක්ෂ හතලිස් අටදහස් හත්සිය හතලිස් හයයි ශත විසිපහ (රු. 59,48,746.25) ක මුදලක් 2009.06.15 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 59,48,746.25ක මුදලට 2009.06.16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4833, 5081 සහ 5080 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, උතුරු ගඟබොඩ පත්තුවේ, උඩවැලිවිටියහි පිහිටි "රේකදහේන" නමැති ඉඩමට බලයලත් මානක ඩී. එස්. එෆ්. විජේසූරිය විසින් මැන සාදන ලද අංක 1225 සහ 1986 දෙසැම්බර් මස 18 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ගාමිණී ගුණවර්ධනට අයත් ඉඩමෙන් ද, නැගෙනහිරට : රජයේ ඉඩමෙන් ද, දකුණට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් වෙලිවිටි කන්දෙන් ද, බස්නහිරට : එලවුදවිල එස්ටේට් වලින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර පහයි පර්චස් දාසය (අ. 5, රූ. 0, පර්. 16)ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, පස්, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 59/70හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ, පාත වැලිවිටියහි පිහිටි "මුදු බෙන්කද" නමැති ඉඩමට සර්වෙයර් ජෙනරාල් විසින් මැන සාදන ලද අංක එෆ්. වී. පී. 609හි ක්ෂේත්‍ර පත්‍ර අංක 0-13/6 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 52කේ " ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 52ජේ වලින් ද, නැගෙනහිරට : ලොට් 243න් ද, දකුණට : ලොට් 93න් ද සහ බස්නාහිරට : ලොට් 93 සහ 52ජේ වලින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර හතරයි, රූඩ් තුනයි, පර්චස් විසිපහ (අ. 4, රූ. 3, පර්. 25) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, පස්, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමග. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. එච් 12/218හි ලියාපදිංචි කර ඇත.

2. පාත වැලිවිටියහි පිහිටි "මුදු බෙන්කද" නමැති ඉඩම අංක එෆ්. වී. පී. 609 දරන පිඹුරෙහි ලොට් 106සී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 105ඩී වලින් ද, නැගෙනහිරට : වඩුවෙලිවිටිය ගමෙන් ද, දකුණට : වඩුවෙලිවිටිය ගමෙන් ද සහ බස්නාහිරට : පාරක් සඳහා වෙන් කරන ලද කොටසකින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් එකොළහ (අ. 1, රූ. 1, පර්. 11)ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, පස්, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. එච්12/219හි ලියාපදිංචි කර ඇත.

3. පාත වැලිවිටියහි පිහි "මුදු බෙන්කද" නමැති ඉඩම අංක එෆ්. වී. පී. 609 දරන පිඹුරෙහි ලොට් 243 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 52ජේ සහ 105 1/2න් ද, නැගෙනහිරට : ලොට් 106ඩී සහ මාදොල ඇලෙන් ද, දකුණට : ලොට් 93න් ද සහ බස්නාහිරට : ලොට් 93 සහ 52කේ වලින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර විසිදෙකයි පර්චස් හතර (අ. 22, රූ. 0, පර්. 4) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, පස්, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. එච්. 12/220 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03-470/6

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හලාවත ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වීරපතිරන් කලයිවානි.

2010.01.07 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටෝ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද, 2004.07.16 වැනි දින සහ අංක 4243 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වීරපතිරන් කලයිවානි යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ අටදහස් හත්සිය එකයි ශත පනස්එක (රු. 3,08,701.51) ක මුදලක් 2009.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,08,701.51ක මුදලට 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4243 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය

මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළට අයත් උතුරු පිටිගල් කෝරළයේ ආනවිලුන්දන් පත්තුවේ, උඩප්පුව ගමෙහි කලාප අංක 6හි මුහුදු වෙරළ පාර, වරිපනම් අංක 34/15ට අයත් "වීඩු වලව් කානී " නමැති ඉඩමට බලයලත් මානක එස්. වෝට්සන් පෙරේරා විසින් 1978 නොවැම්බර් මස 12 වැනි දින අංක 493 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මුතු කාලියාට අයත් වරිපනම් අංක 34/14ට අදාළ ඉඩමෙන් ද, නැගෙනහිරට : රජයට අයත් ඉඩමෙන් ද, දකුණට : ඒ කාලිඅම්මාට අයත් වරිපනම් අංක 34/15ට අදාළ ඉඩමෙන් ද, සහ බස්නාහිරට : වී. සී. පාරෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම හතර (අ. 0, රූ. 1, පර්. 18.4) ක විශාල ඉඩම හලාවත ඩී 139/280 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද පිඹුරේ කොටසක් වන බලයලත් මානක ජේ. ඒ වී. රාජනායගම් විසින් 2004 ජූනි මස 26 වැනි දින අංක 4316 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "1" ලෙස ලකුණු කර ඇති "වීඩු වලව් කානී " නමැති ඉඩම් කොටස උතුරට : පිඹුරු අංක 9560ට අයත් ලොට් 1න් ද සහ එස්. එම්. කාලියට අයත් ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 9560ට අයත් ලොට් 3 සහ 4 න් ද සහ මාවතෙන් ද, දකුණට : ටී. කාලිඅම්මාට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාරෙන් ද සහ පිඹුරු අංක 9560ට අයත් ලොට් 1න් ද මායිම් වූ පිඹුරු ප්‍රකාරව පර්චස් විසිතුනයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 23.2) ක විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03-470/5

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 02/58489/එන්2/091.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. ඒ. ඩබ්. තිසේරා විසින් සහතික කරන ලද 1996.04.30 දින හා අංක 3081 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කඩවත පදිංචි රත්නගොඩ බරනාදුගේ සීතා පද්මිණී සහ ඒකනායක අච්චිල්ලාගේ දයාරත්න ඒකනායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.11.13 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ තිස්හය දහස් හාරසිය අනූපහයි ශත හැට නවයක (රු. 6,36,495.69)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3081 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය අසූ තුනයි ශත හැට හතර (රු. 383.64) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, ඉහල බියන්විල ඔරේන්ජ් බිල් වත්ත හෙවත් මැඩෝනා ඩෙල් ෆ්ලොරා නමැති ඉඩමට 1988.02.03 දින බලයලත් මිනින්දෝරු ඩබ්. සෙනවිරත්න විසින් මැන සකසන ලද අංක 5052 දරන පිඹුරේ කැබලි අංක 44 ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් කොටස මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක සී 315/137 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
වැඩබලන සාමාන්‍යාධිකාරි.

2010 පෙබරවාරි මස 25 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

03-452/5

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කොට්ටාව ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0330-01109627-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.25 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9) යටතේ ලියාපදිංචි කර ඇත ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී. පෙරේරා විසින් සහතික කරන ලද 2007 අප්‍රේල් මස 10 දිනැති අංක 312 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, හෝමාගම පදිංචි කළුබෝවිලගේ දොන් නන්දසිරි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ තුන්දහස් හත්සිය හතලිස් අටයි ශත හයක (රු. 3,03,748.06) මුදලක්, 2009 ජුනි මස 22 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 3,03,748.06 මුදලද, 2009 ජුනි මස 23 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 312 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුව මාගම්මන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. එල්. එන්. චන්දන විසින් සාදන ලද 2005 ජුනි මස 09 දිනැති අංක 3010 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හත්ලාහගොඩ කනත්ත නැමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : කේ. දයානි මල්ලිකා සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : අංක 1208 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 (පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ එකී අංක 3010 දරන සැලැස්ම අනුව පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) නොහොත් හෙක්ටයාර 0.3ක් විශාල වරිපනම් අංක 89/2 දරන ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුව, මාගම්මන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. එස්. විජේසිංහ විසින් සාදන ලද 1999 මැයි මස 18 දිනැති අංක 1208 දරන සැලැස්මේ සඳහන් හත්ලාහගොඩ කනත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කල ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ 2 ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : කේ. ජයසිංහගේ හත්ලාහගොඩ කනත්ත සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ එකී අංක 1208 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 7.7) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

03-459/1

### සෙලාන් බැංකුව පීඑල්සී - කෝපරේට් බැන්කිං ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.12.10 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0864-040483-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් තුනම සහතික කරන ලද 2002 ජනවාරි මස 1 දිනැති අංක 598, 2002 ජනවාරි මස 17 දිනැති අංක 607 සහ 2003 ඔක්තෝබර් 8 දිනැති අංක 852 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 04හි ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 1347 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඉන්ස්ටිටියුට් එෆ් ඩේටා මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි අනූපන් ලක්ෂ විසිහයදහස් තුන්සිය දෙකයි ශත පනස් නවයක (රු. 1,95,26,302.59) මුදලක්, 2009 පෙබරවාරි මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 1,95,26,302.59 මුදල ද, 2009 පෙබරවාරි මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අටක (38%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 598, 607 සහ 852 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි, 2 වැනි සහ 3 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වැනි උපලේඛනය

1. තිරංගදහය කෝරළේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. බී. කලවානේගම විසින් සාදන ලද 2000 පෙබරවාරි මස 17 වැනි දිනැති අංක 1512/1 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 ලෙස ලකුණු කල වරිපනම් අංක 124 (කොටසක්) දරන ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : එකී අංක 1512 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, දකුණට සහ ගිණිකොණට : කුරුණෑගල සිට මීගමුව දක්වා ප්‍රධාන පාර ද, නිරිතට : වඩිවෙල්ගේ උරුමක්කරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ උතුරට සහ වයඹට : සී. ජේ. එෆ්. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ එකී අංක 1512/1 දරන සැලැස්ම අනුව පර්චස් දශම හතරයි තුනක් (අ. 0, රූ. 0, පර්. 0.43) විශාල, ඉඩම මෙය

කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1149/293, ඒ 1473/42 යටතේ ලියාපදිංචි කර ඇත.

2. තිරංගදහය කෝරළේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. බී. කලවානේගම විසින් සාදන ලද 1999 සැප්තැම්බර් මස 25 දිනැති අංක 1512 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 ලකුණු කළ වරිපනම් අංක 124 (කොටසක්) දරන ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : බලයලත් මිනින්දෝරු ඒ. බී. එම්. වෑබර් විසින් සාදන ලද 1988 ජනවාරි මස 20 වැනි දිනැති අංක 188/ඒ දරන සැලැස්මට පිළිතුරු වශයෙන් ලොට් 1සී1 ද, ගිණිකොණට : මීගමුව සිට කුරුණෑගල දක්වා ප්‍රධාන පාර ද, නිරිතට : ඩී. ජේ. එජ්. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන එකී අංක 188ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 1බී1 සහ වයඹට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1999 ජූලි මස 08 දිනැති අංක 88/99 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද යන මායිම් තුළ එකී අංක 1512 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1409/131 යටතේ ලියාපදිංචි කර ඇත.

### 2 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බම්බලපිටියේ පිහිටි කොළඹ මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය වෝඩ් හි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. පී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද 1989.02.23 දිනැති අංක $576^{B}$ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 ලකුණු කළ ගවර් ස්ට්‍රීට් වරිපනම් අංක 38/2 සහ 25 (කොටසක්) ඩේසි විලා ඇවනියු බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ගවර් ස්ට්‍රීට් හි වරිපනම් අංක 38/2 සහ 38/2ඒ කොටසක් දරන පරිශ්‍රය ද. නැගෙනහිරට : ඩේසි විලා ඇවනියු අංක 25 දරන පරිශ්‍රය ද, දකුණට : ඩේසි විලා ඇවනියු ද සහ බස්නාහිරට : ඩුප්ලිකේෂන් පාර ද යන මායිම් තුළ එකී අංක 576බී දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 6.48) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 799/92 හි ලියාපදිංචි කර ඇත.

### 3 වැනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ. කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 39, මිලාගිරිය බම්බලපිටිය ඩේසි විලා ඇවනියු දිගේ පිහිටි දැන් ඩේසි විලා ඇවනියු වරිපනම් අංක 25 දරන බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 01 දිනැති අංක 9259 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු මස 20 දිනැති අංක 2584 දරන මිනුම් සැලැස්මේ සඳහන් ලොට් ඒ ලෙස පෙන්නුම් කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන, මෙම ඉඩම් කොටස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රජයේ මිනින්දෝරු එච්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1981 ජුනි මස 28 දිනැති අංක 68/සීඑච්/13/3549/පීඑස් 53 දරන මිනුම් සැලැස්මේ ලොට් 1 ලෙස ද පෙන්නුම් කරනු ලැබේ) ඉඩම් කොටසට මායිම්, උතුරට : ගවර් ස්ට්‍රීට් වරිපනම් අංක 38/2 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : ඩේසි විලා ඇවනියු වරිපනම් අංක 27 දරන ලොට් බී2 සහ අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් බී1 (පළාත් විථි රේඛා ඇතුළත ඉඩම) ද, දකුණට : ලොට් ඒ2 (පළාත් විථි රේඛා ඇතුළත ඉඩම) සහ බස්නාහිරට : ඩේසි විලා ඇවනියු දැන් වරිපනම් අංක 23 දරන අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ හි කොටසක් ද යන මායිම් තුළ පෙර කී අංක 9259 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.75) හෙක්ටයාර 0.02213 (වර්ග මීටර 221.3) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1019/103 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 39, මිලාගිරිය බම්බලපිටිය ඩේසි විලා ඇවනියු දිගේ පිහිටි දැන් ඩේසි විලා ඇවනියු වරිපනම් අංක 25 දරන බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 01 දිනැති අංක 9259 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ2 ලකුණු කළ (පළාත් විථි රේඛා තුළ ඉඩම) (බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු මස 20 වැනි දිනැති අංක 2584 දරන මිනුම් සැලැස්මේ සඳහන් ලොට් ඒ ලෙස පෙන්නුම් කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන මෙම ඉඩම් කොටස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රජයේ මිනින්දෝරු එච්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1981 ජූනි මස 28 වැනි දිනැති අංක 68/සීඑච්/13/3549/පීඑස්53 දරන මිනුම් සැලැස්මේ ලොට් 2 ලෙස ද පෙන්නුම් කරනු ලැබේ) ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 9259 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ1 ද, නැගෙනහිරට : අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් බී1 (පළාත් විථි රේඛා ඇතුළත ඉඩම) ද, දකුණට : ඩේසි විලා ඇවනියු ද සහ බස්නාහිරට : දැන් ඩේසි විලා ඇවනියු දැන් වරිපනම් අංක 23 දරන අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ හි කොටසක් ද යන මායිම් තුළ පෙර කී අංක 9259 දරන සැලැස්ම අනුව පර්චස් බිංදුවයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 0.70) හෙක්ටයාර 0.00177 (වර්ග මීටර 17.7) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1019/104 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

03-457/3

---

## සෙලාන් බැංකුව පීඑල්සී - මිලේනියම් ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.01 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0860-011140-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කුගදරන් විසින් සහතික කරන ලද 2006 ජුනි මස 5 දිනැති අංක 749 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම රත්මලාන ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 1937 දරන ශ්‍රීලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන කියුපිඩ් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී

බැඳුම්කරය යටතේ රුපියල් හාරකෝටි විසිඑක්ලක්ෂ තිස්හත්දහස් නවසිය දහතුනයි ශත පනස් අටක (රු. 4,21,37,913.58) මුදලක්, 2009 සැප්තැම්බර් මස 21 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,21,37,913.58 මුදල ද, 2009 සැප්තැම්බර් මස 22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 749 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ. දෙහිවල-ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ රත්මලාන දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1993 ජූලි මස 16 දිනැති අංක 2859 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රත්මලාන ගාලු පාර වරිපනම් අංක 493 දරන දැන් කියුපිඩ් ටුවර්ස් ලිමිටඩ් නමින් හඳුන්වනු ලබන කඳවල එස්ටේට් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල (බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1972 සැප්තැම්බර් මස 10 වැනි දිනැති අංක 1108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 සහ 2 හි එකතුවක අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ රත්මලාන පොදු වෙළඳ පොල පරිශ්‍රය සහ ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 3 සහ ලොට් 4 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) දකුණට : ලොට් 4 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : තෙල් සංස්ථා දේපළ ද යන මායිම් තුළ එහි අංක 2859 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් විසිහයයි (අ. 0, රූ. 1, පර්. 26) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හයයි හයයි නවයක් (හෙක්ට යාර 0.1669) විශාල ගස් වගා සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එහි 2036/20 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී පරිදි රත්මලාන පිහිටි එකී අංක 2859 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රත්මලාන ගාලු පාර වරිපනම් අංක 493/2 දරන දැන් කියුපිඩ් ටුවර්ස් ලිමිටඩ් නමින් හඳුන්වනු ලබන කඳවල එස්ටේට් නමැති ඉඩමේ ලොට් 2ඒ ලකුණු කළ (පෙර කී අංක 1108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 සහ 2 හි එකතුවක අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලොට් 3 සහ රත්මලාන ගුවන් තොටුපල ඉඩම ද, නැගෙනහිරට : ගාලු පාර වරිපනම් අංක 497 දරන රත්මලාන ගුවන් තොටුපල ඉඩම සහ ලොට් 2බී, දකුණට : ලොට් 2බී සහ කොළඹ-ගාල්ල පාර සහ බස්නාහිරට : ලොට් 3 සහ 4 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ එකී අංක 2859 දරන සැලැස්ම අනුව පර්චස් තිස්අටයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 38.90) විශාල ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2036/21 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී පරිදි රත්මලාන පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1993 ජූලි මස 16 දිනැති අංක 2859 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රත්මලාන ගාලු පාර වරිපනම් අංක 493/1 දරන දැන් කියුපිඩ් ටුවර්ස් ලිමිටඩ් නමින් හඳුන්වනු ලබන කඳවල එස්ටේට් නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ (පෙර කී අංක 1108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 සහ 2 හි එකතුවක අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ රත්මලාන පොදු වෙළඳ පොල පරිශ්‍රය ද, නැගෙනහිරට : රත්මලාන ගුවන් තොටුපොල ඉඩම සහ ලොට් 2, දකුණට : ලොට් 1 සහ 2ඒ සහ ලොට් 4 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ රත්මලාන පොදු වෙළඳ පොල පරිශ්‍රය සහ ලොට් 1 යන මායිම් තුළ එකී අංක 2859 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 16.40) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි එකයි පහයි (හෙක්ටයාර් 0.0415) ක් විශාල ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2036/22 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

පෙර කී පරිදි රත්මලාන පිහිටි බලයලත් මිනින්දෝරු ඩී ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1993 ජූලි මස 16 දිනැති අංක 2859 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් කියුපිඩ් ටුවර්ස් ලිමිටඩ් නමින් හඳුන්වනු ලබන කඳවල එස්ටේට් නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) (පෙර කී අංක 1108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 සහ 2හි එකතුවක අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ 3 ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 2 සහ කොළඹ-ගාලු පාර සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ එකී අංක 2859 දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.60) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි දෙකයි එකක් (හෙක්ටයාර් 0.521) ක් විශාල ඉඩම. මෙය ගල්කිස්ස දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2036/23 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-458

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කෝපරේට් බෑන්කිං යුනිට් ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0864-348738-001/0864-348738-002.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර

ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. කේ. විජේරත්න විසින් සහතික කරන ලද 2006 ජනවාරි මස 10 දිනැති අංක 684 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මාලබේ සංස්ථාගත කිරීමේ සහතික අංක එන් (පීවීඑස්) 20464 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන වොන්ඩර්ලයිට් කන්සියුමර් ප්‍රඩක්ට්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි හැටඑක්ලක්ෂ පනස්අටදහස් හාරසිය එකොලහයි ශත අසූ හතක (රු. 2,61,58,411.87) මුදලක්, 2009 අගෝස්තු මස 10 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 2,61,58,411.87 මුදලද, 2009 අගෝස්තු මස 11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 684 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලඹේ සහ තලංගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් සාදන ලද 2005 ජූලි මස 17 වැනි දිනැති අංක 185/2005 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිල්ලගහවත්ත, කැකිරිහේනලන්ද, ඇටඹගහවත්ත සහ කොස්ගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1990 ජූලි මස 28 වැනි දිනැති අංක 1643 දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ, 1බී සහ 1සී වල එකතු කිරීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කිතන්දෙනිය කුඹුර, එල්. සෙනෙවිරත්න විසින් හිමිකම් කියනු ලබන දේපළ, රංජිත් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ පියදාස පෙරේරා විසින් හිමිකම් කියනු ලබන දේපළ ද, නැගෙනහිරට : පියදාස පෙරේරා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ අඩි 20ක් පළල පාර ද, දකුණට : එන්. සී. කේ. පින්තු විසින් හිමිකම් කියනු ලබන දේපළ. සී. ඩී. ශාන්තිලතා විසින් හිමිකම් කියනු ලබන දේපළ, සී. ඩී. සුමනාවතී විසින් හිමිකම් කියනු ලබන දේපළ, කේ. අමරදාස පෙරේරා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ කේ. චාර්ල්ස් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : කේ. චාර්ල්ස් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ කිතන්දෙනිය කුඹුර යන මායිම් තුළ එකී අංක 185/2005 දරන සැලැස්ම අනුව අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් පහක් (අ. 3, රූ. 2, පර්. 5) *නොහොත්* (හෙක්ටයාර් 1.42905) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 1619/42 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් පාර සඳහා වෙන් කිරීම තුළ උඩින් යටින් සහ දිගේ මර්ග අයිතිය සහ සියලු වෙනත් අයිතීන් සමග.

1. පෙර කී මාලඹේ සහ තලංගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1971 ඔක්තෝබර් මස 15 වැනි දිනැති අංක 1601 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිල්ලගහවත්ත, කැකිරිහේනලන්ද සහ ඇටඹගහවත්ත නමැති ඉඩමේ ලොට් 1සී ලකුණු කළ එකී අංක 1601 දරන සැලැස්ම අනුව පර්චස් දහනවයක් (අ. 0, රූ. 0, පර්. 19) ක් විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 805/28 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී මාලඹේ සහ තලංගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1970 මැයි මස 07 දිනැති අංක 1488 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 සහ 2 ලකුණු කළ ප්‍රමාණය පිළිවෙලින් පර්චස් දොළහක් (අ. 0. රූ. 0, පර්. 12) සහ පර්චස් දහතුනයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 13.2) විශාල ලොට් 1 සහ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 805/29 සහ ජී 805/30 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-457/2

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කෝපරේට් බැන්කිං යුනිට් ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.12.10 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0864-එම්10063-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල් ජයසේකර විසින් සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 16 දිනැති අංක 1197 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 04හි ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 3340 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඉන්ස්ටිටියුට් ඔෆ් ඩේටා මැනේජ්මන්ට් කම්පියුටර් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කොළඹ 04හි ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 1347 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඉන්ස්ටිටියුට් ඔෆ් ඩේටා මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්එක්ලක්ෂ අසූහතරදහස් එකසිය හැටයි ශත තිස් හයක (රු. 41,84,160.36) මුදලක්, 2009 පෙබරවාරි මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 41,84,160.36 මුදලද, 2009 පෙබරවාරි මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට

යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 1197 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 39, මිලාගිරිය බම්බලපිටිය ඩේසි විලා ඇවනියු දිගේ පිහිටි දැන් ඩේසි විලා ඇවනියු වරිපනම් අංක 25 දරන බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 01 දිනැති අංක 9259 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු 20 වැනි දිනැති අංක 2584 දරන මිනුම් සැලැස්මේ සඳහන් ලෙස ඒ ලෙස පෙන්නුම් කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන මෙම ඉඩම් කොටස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රජයේ මිනින්දෝරු එච්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1981 ජූනි මස 28 දිනැති අංක 68/සීඑච්/13/3549/පීඑස් 53 දරන මිනුම් සැලැස්මේ ලොට් 1 ලෙස ද පෙන්නුම් කරනු ලැබේ) ඉඩම් කොටසට මායිම්, උතුරට : ගවර් ස්ට්‍රීට් වරිපනම් අංක 38/2 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : ඩේසි විලා ඇවනියු වරිපනම් අංක 27 දරන ලොට් බී2 සහ අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් බී1 (පළාතේ වීථි රේඛා ඇතුළත ඉඩම) ද, දකුණට : ලොට් ඒ2 (පළාත් වීථි රේඛා ඇතුළත ඉඩම) සහ බස්නාහිරට : ඩේසි විලා ඇවනියු දැන් වරිපනම් අංක 23 දරන අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ හි කොටසක් ද යන මායිම් තුළ පෙර කී අංක 9259 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.75) හෙක්ටයාර් 0.02213 (වර්ග මීටර් 221.3) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1019/255 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 39 මිලාගිරිය බම්බලපිටිය ඩේසි විලා ඇවනියු දිගේ පිහිටි දැන් ඩේසි විලා ඇවනියු වරිපනම් අංක 25 දරන බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 01 වැනි දිනැති අංක 9259 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ2 ලකුණු කළ (පළාත් වීථි රේඛා තුළ ඉඩම) (බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු මස 20 වැනි දිනැති අංක 2584 දරන මිනුම් සැලැස්මේ සඳහන් ලොට් ඒ ලෙස පෙන්නුම් කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන මෙම ඉඩම් කොටස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රජයේ මිනින්දෝරු එච්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1981 ජූනි මස 28 දිනැති අංක 68/සීඑච්/13/3549/පීඑස් 53 දරන මිනුම් සැලැස්මේ ලොට් 2 ලෙස ද පෙන්නුම් කරනු ලබන) ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 9259 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ1 ද, නැගෙනහිරට : අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් බී1 (පළාත් වීථි රේඛා ඇතුළත ඉඩම) ද, දකුණට : ඩේසි විලා ඇවනියු ද සහ බස්නාහිරට : දැන් ඩේසි විලා ඇවනියු දැන් වරිපනම් අංක 23 දරන අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ හි කොටසක් ද යන මායිම් තුළ පෙර කී අංක 9259 දරන සැලැස්ම අනුව පර්චස් බිංදුවයි දශම හතයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 0.70) හෙක්ටයාර් 0.00177 (වර්ග මීටර් 17.7) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1019/256 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-457/1

---

## සෙලාන් බැංකුව පීඑල්සී - අම්පාර ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.23 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0910-01746934-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. පෙරින්පරාජා, ජේ. පී. යූ. එම්. විසින් සහතික කරන ලද 2006 මාර්තු මස 28 දිනැති අංක 440 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පොතුවිල් - 15 පදිංචි අබූබකර් මොහමඩ් ජවුෆර් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඅටලක්ෂ හයදහස් නවසිය පනස් හතයි ශත පනස් තුනක (රු. 28,06,957.53) මුදලක්, 2007 නොවැම්බර් මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 28,06,957.53 මුදලද, 2007 නොවැම්බර් මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 440 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ පනමෙයිපත්තු පොතුවිල් පිහිටි ජලල්දීන් ස්ක්වෙයාර් පී4 හි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 1,

පර්. 28) ක් විශාල ඉඩම් කොටසට මායිම්, උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : 20 නිවාස යෝජනා ක්‍රමය ද, දකුණට : ඒ සාපුරා උම්මාට අයිති ඉඩම ද සහ බස්නාහිරට : ඊ. එල්. අහමඩ් ලෙබ්බේට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය අම්පාර ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව පී 06/124හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරන්දෙනිය විසින් සාදන ලද 2005.08.23 දිනැති අංක 5128 දරන සැලැස්ම අනුව.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පනමෙයිපත්තු පොතුවිල් ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ පොතුවිල් පිහිටි ජලල්දීන් ස්ක්වෙයාර් නමැති ඉඩමට මායිම්, උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : 20 නිවාස යෝජනා ක්‍රමය ද, දකුණට සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් විසි හයයි දශම හතයි අටක් (අ. 0, රූ. 1, පර්. 26.78) විශාල ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

03-321/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - උපාධිධාරී ව්‍යවසායකත්ව ණය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.10.16 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0400-02035950-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් විරාජ් වික්‍රමරත්න විසින් දෙකම සහතික කරන ලද 2007 මාර්තු මස 14 දිනැති අංක 127 සහ 2008 අගෝස්තු මස 28 දිනැති අංක 210 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පානදුර පදිංචි දොඩම්පෙ ගමගේ චන්දන පුෂ්ප කුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්පන්ලක්ෂ හතලිස්දහස් පන්සිය හතලිස් හතයි ශත හැත්තෑහතක (රු. 55,40,547.77) මුදලක්, 2009 අප්‍රේල් මස 22 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 55,40,547.77 මුදලද, 2009 අප්‍රේල් මස 23 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට දහ අට (18%) සහ විසි එක (21%) බැගින් වු පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 127 සහ 210 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි බැද්ද පානදුර ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උපකාර්යාල ප්‍රාදේශීය තුළ ගොරකපොල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1991.10.11 දිනැති අංක 3578 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාදංගහවත්ත ඕවිට හෙවත් මාදංගහවත්ත පාවුල ඕවිට නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් දෙකම සාදන ලද 1988.08.27 දිනැති අංක 2682 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 සහ 1991.01.03 දිනැති අංක 3346 දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ එකතු කිරීමක් වන) මායිම්, උතුරට : අංක 2682 දරන සැලැස්මේ සඳහන් මෙම ඉඩමේ ලොට් 1 බී. එල්. ඩී. ප්‍රනාන්දුගේ දේපළ) ද, නැගෙනහිරට : ගාලු පාර ද, දකුණට : අංක 3346 දරන සැලැස්මේ සඳහන් මෙම ඉඩමේ ලොට් බී (බී. චන්ද්‍රානි ප්‍රනාන්දුගේ දේපළ) ද, සහ බස්නාහිරට : බී. චන්ද්‍රානි ප්‍රනාන්දුගේ සහ බී. එල්. ඩී. ප්‍රනාන්දුගේ කල්තොටයා වත්ත (කලින් මියගිය බී. ඒ. ප්‍රනාන්දුගේ උරුමක්කරුවන්ගේ) යන මායිම් තුළ පර්චස් නවයයි දශම අටයි හතක් (අ. 0, රූ. 0, පර්. 9.87) විශාල. එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කීරීමේ කාර්යාලයේ එෆ් 540/32 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩම්වල එකතු කිරීමක් වේ.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර බැද්ද, පානදුර තල්පිටි දෙබැද්ද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල කොට්ඨාසය තුළ ගොරකපොල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1988.08.27 දිනැති අංක 2687 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාදංගහවත්ත ඕවිට හෙවත් මාදංගහවත්ත පාවුල ඕවිට නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1988.08.27 දිනැති අංක 2682 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : කොළඹ සිට ගාල්ල දක්වා මහා මාර්ගය ද, දකුණට : දැන් බී. ඒ. ප්‍රනාන්දුගේ උරුමක්කරුවන්ට අයිති කලින් බී. දාවිත් ප්‍රනාන්දුට අයිතිව තිබු ඉඩම ද, සහ බස්නාහිරට : කලින් බී. ඒ. ප්‍රනාන්දුගේ උරුමක්කරුවන්ට අයිතිව තිබූ තලපත්යාය වත්ත යන මායිම් තුළ පර්චස් හතයි දශම අටයි හතක් (අ. 0, රූ. 0, පර්. 7.87) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කීරීමේ කාර්යාලයේ එෆ් 203/363 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර බැද්ද පානදුර තල්පිටි දෙබැද්ද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල කොට්ඨාසය තුළ ගොරගපොල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1991.01.03 දිනැති අංක 3346 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාදංගහවත්ත ඕවිට හෙවත් මාදංගහවත්ත පාවුල ඕවිට නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1988.08.27 දිනැති අංක 2682 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : කොළඹ සිට ගාල්ල දක්වා මහා මාර්ගය ද, දකුණට : එකී සැලැස්මේ සඳහන් ලොට් බී සහ බස්නාහිරට : කලින් බී. ඒ. ප්‍රනාන්දුට අයිතිව තිබූ කොට්ටම්බාගහ වත්ත ද යන මායිම්

තුළ පර්චස් දෙකක් (අ. 0, රූ. 0, පර්. 2) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 228/72 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-321/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එන්. ඒ. එදිරිසිංහ.
ගිණුම් අංකය : 0003 5004 4116.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ මැයි මස 14 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 අගෝස්තු මස 11 දාතම හා අංක 1285 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැදිවෙල, ඔබහේන පාර, අංක 32/4හි දැනට පදිංචි නුගේගොඩ, කන්දේවත්ත පටුමග, අංක 29සී, හි පදිංචි නගී අරවින්ද එදිරිසිංහ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර අංක 1285 ප්‍රකාර ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාහත් ලක්ෂ පනස් හත් දහස් පන්සිය හැටයි ශත අනූතුනක (රු. 17,57,560.93) මුදලක් 2009 ජනවාරි මස 29 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මාර්තු මස 20 දාතම හා අංක 1961 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීමට නගී අරවින්ද එදිරිසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර අංක 1961 ප්‍රකාර ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන්ලක්ෂ අසූ දෙදහස් හාරසිය අසූ හතයි ශත හැට හතරක (රු. 5,82,487.64) මුදලක් 2009 ජනවාරි මස 29 වැනි දිනට පෙර එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

එකී බැඳුම්කර 1285 හා 1961 ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් රුපියල් විසිතුන් ලක්ෂ හතලිස් දහස් හතලිස් අටයි ශත පනස් හතක (රු. 23,40,048.57) මුදලක් 2009 ජනවාරි මස 29 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිතුන් ලක්ෂ හතලිස් දහස් හතලිස් අටයි ශත පනස් හතක (රු. 23,40,048.57) මුදල ද, 2009 ජනවාරි මස 30 වැනි දින සිට අංක 1285 හා 1961 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහසය ලක්ෂ පනස්තුන් දහස් හතලිස් නමයයි ශත හතලිස් හතක (රු. 16,53,049.47) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දාහතරක් (14%) බැගින් වූ පොළිය ද, තවත් රුපියල් පන්ලක්ෂ හැත්තෑ නම දහස් හයසිය අනූ දෙකයි ශත දහහතරක (රු. 5,79,692.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1285 සහ 1961 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි , 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ ඔබහේන පාරෙන් හැරී මැදිවෙල පිහිටි ඔබහේන පාර වරිපනම් අංක 32/4 දරන "මිල්ලගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. එන්. ඒ. අල්විස් යන අය විසින් සාදන ලද 2004 ඔක්තෝබර් මස 21 දාතම හා අංක 1693 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 5, නැගෙනහිරට : ලොට් 4, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : බී. එච්. නිමල් විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද පිඹුරු අංක 1693ට අනුව වෙළුම/පත්‍රිරුව එම් 2812/239හි ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/8

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

බී. ටී. රූපසිංහ.
ගිණුම් අංකය : 1042 5341 5109.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන සී. ජී. අබේවික්‍රම යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජුනි මස 25 දාතම හා අංක 239 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බිමල් ටාන්‍යා රූපසිංහ යන අය බන්ධදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කර අංක 239 ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැටනම ලක්ෂ හැත්තෑදහස් එකසිය තුනයි ශත හැත්තෑහතරක (රු. 69,70,103.74) මුදලක් 2009 මැයි මස 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැටනම ලක්ෂ හැත්තෑදහස් එකසිය තුනයි ශත හැත්තෑහතරක (රු. 69,70,103.74) මුදල ද 2009 මැයි 26 දින සිට අංක 239 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නමලක්ෂ හතලිස් එක් දහස් දෙසිය හතලිස් එකයි ශත හතලිස් අටක (රු. 59,41,241.48) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 239 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ කොල්ලුපිටිය තර්ස්ටන් පාර සහ ඇල්ෆ්‍රඩ් පෙදෙස පිහිටි ඇල්ෆ්‍රඩ් පෙදෙස වරිපනම් අංක 39 1/1 දරන මහල් නිවාස පරිශ්‍රයේ මහල් නිවාස ගොඩනැගිල්ලේ බටහිර කොටසේ පළමු මහලේ පිහිටි වර්ග අඩි 1,260ක බිම් ප්‍රමාණයෙක් සහ ඇල්ෆ්‍රඩ් පෙදෙස සමීප පොදු පිවිසුම් පෙදෙසක් ලෙස බලයලත් මානක තැන එම්. එස්. ටී. පී. සේනාධීර යන අය විසින් සාදන ලද 1974 ජනවාරි මස 23 දාතම හා අංක 732 දරන මහල් නිවාස පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ඒකක 5 වශයෙන් ලකුණු කොට ඇති නිදන කාමර දෙකක් සහිත වාසස්ථාන පරිශ්‍රයට මායිම්, උතුරට : මෙම ඒකකයේ උතුරු බිත්තියේ මැද සහ මෙම ඒකකයේ බටහිර බැල්කනියේ උතුරු බිත්තියේ මැද, නැගෙනහිරට : මෙම ඒකකයේ නැගෙනහිර බිත්තියේ මැද සහ වයි වශයෙන් ලකුණු කොට ඇති තරප්පු පෙලේ සහ බිමට බසින ස්ථානයේ බටහිර බිත්තියේ මැද, දකුණට : මෙම ඒකකයේ දකුණු බිත්තියේ මැද සහ වයි වශයෙන් ලකුණු කොට ඇති තරප්පු පෙලේ සහ බිමට බසින ස්ථානයේ උතුරු බිත්තියේ මැද සහ මෙම ඒකකයේ බටහිර බැල්කනියේ දකුණු බිත්තියේ මැද සහ බස්නාහිරට : මෙම ඒකකයේ බටහිර බිත්තියේ මැද සහ දෙවැනි මහලේ ඒකක 7 බිම මැද මෙම ඒකකයේ මුදුනේ (හිස්) බටහිර බැල්කනියේ මැද සහ මෙම ඒකකයේ බිම මැද පා පස වෙළුම/පත්‍රිරුව Con A 170/52 හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

1974 අංක 23 දාතම හා මහල් නිවාස පිඹුරු අංක 732හි නිරූපිත පොදු මූලික අංගයන් භාවිතා කිරීමට ඇති අයිතිය ද සමග ය.

*පොදු මූලික අංග :*

බලයලත් මානක තැන එම්. එස්. ටී. පී. සේනාධීර යන අය විසින් සාදන ලද 1974 ජනවාරි මස 23 දාතම හා අංක 732 දරන මහල් නිවාස පිඹුරේ නිරූපිත Z වශයෙන් ලකුණු කොට ඇති පියගැට පෙළ සහ බිමට බසින ස්ථානය සඳහා මායිම් පහත සඳහන් පරිදි ය :

උතුරට : Z වශයෙන් ලකුණු කොට ඇති පියගැට පෙළ සහ බිමට බසින ස්ථානයේ උතුරු බිත්තියේ මැද, නැගෙනහිරට : Z වශයෙන් ලකුණු කොට ඇති පියගැට පෙළ සහ බිමට බසින ස්ථානයේ නැගෙනහිර බිත්තියේ මැද, දකුණට : Z වශයෙන් ලකුණුකොට ඇති පියගැට පෙල සහ බිමට බසින ස්ථානයේ දකුණු බිත්තියේ මැද සහ බස්නාහිරට : Z වශයෙන් ලකුණුකොට ඇති පියගැට පෙළ සහ බිමට බසින ස්ථානයේ බටහිර බිත්තියේ මැද, දෙවන මහලේ මහල් නිවාස අංක 39 2/1 සීලිම මත සහ Z වශයෙන් ලකුණු කොට ඇති පියගැට පෙළ සහ බිමට බසින ස්ථානයේ බිම මැද වර්ග අඩි 440 ක බිම් පෙදෙස පතුල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-481/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. එස්. එම්. ෆසිල්.
හිණුම් අංකය : 1017 5338 7092.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. ඩී. ප්‍රසංග යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජුනි මස 13 දාතම හා අංක 464 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහොමඩ් සහීඩ් මොහොමඩ් ෆසීල් යන අය බන්ධදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් පන්ලක්ෂ හැත්තෑ නම දහස් අටසිය තිස්තුනයි ශත තිස් දෙකක (රු. 45,79,833.32) මුදලක් 2009 නොවැම්බර් මස 24 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් පන්ලක්ෂ හැත්තෑ නම දහස් අටසිය තිස්තුනයි ශත තිස් දෙකක (රු. 45,79,833.32) මුදල ද 2009 නොවැම්බර් 25 දින සිට අංක 464 දරන එකී බැඳුම්කරය මත අයවිය

යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස්අටලක්ෂ හැත්තෑදහස් දෙසීය හැට අටයි ශත හැත්තෑ එකක (රු. 38,70,268.71) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 464 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ දකුණු රත්මලාන පිහිටි පරණ ගුවන්තොටුපල පාර වරිපනම් අංක 8/2 දරන ඉඩමට බලයලත් මානක තැන එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 2008 ජූනි මස 02 දාතම හා අංක 16/2008 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 5ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පරණ ගුවන් තොටුපල පාර, වරිපනම් අංක 8/1 දරන පරිශ්‍රයන් (අංක 94/23 දරන පිඹුරේ ලොට් 6), නැගෙනහිරට : පරණ ගුවන්තොටුපල පාර වරිපනම් අංක 8ඒ/2 දරන පරිශ්‍රයන් (අංක 94/23 දරන පිඹුරේ ලොට් 11), දකුණට : කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයිති ඉඩම සහ බස්නාහිරට : පරණ ගුවන්තොටුපල පාර වරිපනම් අංක 6ඒ/2 දරන පරිශ්‍රයන් (අංක 94/23 දරන පිඹුරේ ලොට් 03) සහ අඩි 12 පළල පාර (අංක 94/23 දරන පිඹුරේ ලොට් 4) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි දෙකක් (අ. 0, රූ. 0. පර්. 8.72) හෝ හෙක්ටයාර් 0.02206 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 16/2008 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එම් 3146/189 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 5ඒ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ දකුණු රත්මලාන පිහිටි පරණ ගුවන් තොටුපල පාර වරිපනම් අංක 8/2 දරන ඉඩමට බලයලත් මානක තැන එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 1994 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 94/23 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 5 (එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 1994 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 94/19 දරන පිඹුරේ ලොට් X හි උප බෙදුමක් වන ලොට් 5) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 6 සහ 10, නැගෙනහිරට : ලොට් 11, දකුණට : කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයිති ඉඩම සහ බස්නාහිරට : ලොට් 03 සහ 04 සහ (අඩි 12 පළල පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 8.72) හෝ හෙක්ටයාර් 0.02206 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 94/23 දරන පිඹුරට අනුවය.

අංක 94/23 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 සහ 9 දිගේ හා මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/7

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ජී. ජී. සී. පෙරේරා.
ගිණුම් අංකය : 1013 5010 2451.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 නොවැම්බර් මස 10 දාතම හා අංක 1523 දරන සහ 2007 සැප්තැම්බර් මස 14 දාතම හා අංක 1716 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගල්හේනගේ ගංගන චාමික පෙරේරා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන්ලක්ෂ පනස් නම දහස් හාරසිය හැටතුනයි ශත දහනමයක (රු. 5,59,463.19) මුදලක් 2009 නොවැම්බර් මස 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පන්ලක්ෂ පනස් නම දහස් හාරසිය හැටතුනයි ශත දහනමයක (රු. 5,59,463.19) මුදල ද 2009 නොවැම්බර් මස 28 දින සිට අංක 1523 සහ 1716 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරලක්ෂ අනූඑක් දහස් තුන්සිය දහසයයි ශත හැත්තෑහතක (රු. 4,91,316.77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1523 සහ 1716 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාවන් තුළ බොරලැස්ගමුව ග්‍රාමයේ පිහිටි මහරගම පාර වරිපනම් අංක 123/9 දරන "කෝන්ගහවත්ත නොහොත් සම්බුද්ධි කෝන්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. වී. එම්. ඩබ්ලිව්. සමරනායක යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු මස 31 දාතම හා අංක 2969 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් එෆ්ජී 4ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලේක් පාර වරිපනම් අංක 123/10, අංක 4561 දරන පිඹුරේ ලොට් 1 (අංක 4108 දරන පිඹුරේ ලොට් එෆ්ජී 4ඒ හි කොටසක්), නැගෙනහිරට : තල්ගහවත්ත පාර වරිපනම් අංක 14/7 සහ 10/7, දකුණට : අංක 4108 දරන පිඹුරේ ලොට් එෆ්ජී 7 සහ බස්නාහිරට : අඩි 20 පළල පාර (අංක 4108 දරන පිඹුරේ ලොට් එෆ්ජී 10) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතින් ද, වරප්‍රසාදයන්, ප්‍රවශ්‍යතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2969 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එම් 2835/243 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග යː

නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එම් 2292/225 යටතේ ලියාපදිංචි කොට ඇති අංක 4108 දරන පිඹුරේ ලොට් එෆ්ජී 10.

බලයලත් මානත තැන ඩී. ජේ. හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1974 ඔක්තෝබර් මස 13 දාතම හා අංක 251 දරන පිඹුරේ නිරූපිත ලොට් 4.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. බී. අනුර.
ගිණුම් අංකය : 0104 5000 1398.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ යන අය විසින් ලියා සහතික කරන ලද 2008 සැප්තැම්බර් මස 05 දාතම හා අංක 1316 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මනික්කු බදුගේ අනුර යන අය බන්ධනදායී වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ අසූ දෙදහස් දෙසිය දාහතයි ශත අසූ පහක (රු. 7,82,217.85) මුදලක් 2009 දෙසැම්බර් මස 29 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හත්ලක්ෂ අසූ දෙදහස් දෙසිය දාහතයි ශත අසූ පහක (රු. 7,82,217.85) මුදල ද 2009 දෙසැම්බර් මස 30 දින සිට අංක 1316 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හයලක්ෂ පනස් හයදහස් පන්සිය අටයි ශත හැත්තෑ හතරක (රු. 6,56,508.74) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1316 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි , 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර ගිරුවා පත්තුවේ කිවුල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිවුල පිහිටි ප්‍රදාන ඔප්පු අංක හම්/2/ප්‍ර/28318 / හම්/අම්/153/1598 හි නිරූපිත සීමා නිර්ණය කොට ඇති ඉඩමට මායිම්, උතුරට : ජේ. එම්. පුංචිසිංඤෝ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ක්‍රීඩා පිටිය සහ පෙර පාසැල, දකුණට : ඒ. එස්. ජී. සිරිපාල යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : එම්. බී. සුමනදාස, ජේ. එච්. සුනිල් සෝමසිරි යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි නමයයි හතරක් (0.194 හෙක්ටයාර්) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග ය.

මැත සිදුකරන ලද මිනුම් දැක්වීමට අනුව එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇත :

එකී කිවුල පිහිටි බලයලත් මානක තැන එච්. එච්. ධර්මදාස යන අය විසින් සාදන ලද 2008.07.31 දාතම හා අංක 310 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජේ. එච්. පුංචිසිංඤෝ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ක්‍රීඩා පිටිය සහ පෙර පාසැල, දකුණටː ප්‍රධාන පාරේ සිට නිවාස දක්වා දිවෙන පාර සහ ඒ. එස්. ජී. සිරිපාල යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : එම්. බී. සුමනදාස, ජේ. එච්. සුනිල් සෝමසිරි යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි නමයයි හතරක් (0.194 හෙක්ටයාර්) රූඩ් එකයි, පර්චස් තිස් හයයි දශම හතක් (අ. 0, රූ. 1, පර්. 36.7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 310

දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එල්. ඩී. ඕ. 5/68 යටතේ හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/3

---

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - බම්බලපිටිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විදිශා ශ්‍යාමා කුමාරි විජේරත්න සහ නල්ලහන්දි සුරේන්ද්‍ර ද සිල්වා විජේරත්න (''ගුඩ්වුඩ් ද කාපෙන්ටර්ස් '' යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන)

2009.10.28 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.11.22 දින සහ අංක 3806 සහ 3808 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම (''ගුඩ්වුඩ් ද කාපෙන්ටර්ස් '' යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන) විදිශා ශ්‍යාමා කුමාරි විජේරත්න සහ නල්ලහන්දි සුරේන්ද්‍ර සිල්වා විජේරත්න යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්ලක්ෂ අනූනමදහස් විසිතුනයි ශත හතලිහ (රු. 3,99,023.40) ක මුදලක් 2009.07.31 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,99,023.40ක මුදලට 2009.08.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3806 සහ 3808 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, ඕවිටිගම පිහිටි මිල්ලගහකනත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද 1997.05.19 දින සහ අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 11 දරන බෙදා වෙන්කළ සහ නිශ්චිත ඉඩම වන උතුරට : බලයලත් මානක ඩී. පී. ඒ. ජයසිංහ විසින් 1960.10.03 සහ 1960.10.05 සහ 1960.11.16 දිනයන්හි මැන සාදන ලද පිඹුරු අංක 238හි ලොට් අංක 10න් ද, නැගෙනහිරට : ලොට් අංක 12 සහ 13න් ද, දකුණට : ලොට් අංක 13 සහ 31 න් ද, සහ බස්නාහිරට : ලොට් අංක 10න් ද මායිම් වූ එකී අංක 1227 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම එකයි හතර (අ. 0. රූ. 0, පර්. 12.14) හෝ හෙක්ටයාර් 0.0307ක් විශාලත්වය ඇති මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 222/186 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, ඕවිටගම පිහිටි මිල්ලගහකනත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද 1997.05.19 දින සහ අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 12 දරන බෙදා වෙන්කළ සහ නිශ්චිත ඉඩම වන උතුරට : පිඹුරු අංක 238ඒ හි ලොට් අංක 9 සහ 10න් ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 238ඒ හි ලොට් අංක 9න් ද, දකුණට : ලොට් අංක 32 න් ද, සහ බස්නාහිරට : ලොට් අංක 13 සහ 11 න් ද මායිම් වූ එකී අංක 1227 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම නමයයි එක (අ. 0. රූ. 0, පර්. 10.91) ක් විශාලත්වය ඇති මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 222/187 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 3806 සහ 3808 දරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-470/2

---

## සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. කරුණානන්ද විසින් ලියා සහතික කරන ලද අංක 93 සහ 2005 පෙබරවාරි මස 09 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කඩුවෙල, අනුර ශාන්තරාජ් අමරසිංහ සහ පතිරගේ දෝන රේණුකා පීරිස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2009 අප්‍රේල් මස 30 වැනි දිනට ඉහත කී අංක 93 දරන උකස් බැඳුම්කරය මත එකී අනුර ශාන්තරාජ් අමරසිංහ සහ පතිරගේ දෝන රේණුකා පීරිස් යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් දහතුන්ලක්ෂ හතලිස්අටදහස් අනූඑකකුත් ශත පහළොවක (රු. 13,48,091.15) මුදලක් සහ 2009 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එම දහතුන්ලක්ෂ හතලිස්අටදහස් අනූඑකකුත් ශත පහළොවක (රු. 13,48,091.15) මුදල සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහතුන්ලක්ෂ හතලිස් අටදහස් අනූඑකකතුත් ශත පහළොවක (රු. 13,48,091.15) මුදලක් සහ 2009 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එම දහතුන්ලක්ෂ හතලිස්අටදහස් අනූ එකකුත් ශත පහළොවක (රු. 13,48,091.15) මුදල සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 93 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 93 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ, වැලිවිට පිහිටි බටදොඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. දේවසුරේන්ද්‍ර විසින් මැන සකස් කරන ලද අංක 151 හා 1994 ජූනි මස 02 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන "ලොට් ඩී" ලෙස ලකුණු කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : එස්. ජේන්නෝනාට අයිති ඉඩම සහ "ලොට් සී " දරන (අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගයක් වූ) බිම් කට්ටිය ද, නැගෙනහිරට : "ලොට් ඊ" දරන කට්ටිය ද, දකුණට : "ලොට් ඊ" දරන කට්ටිය ද, බස්නාහිරට : "ලොට් එෆ් " දරන කට්ටිය ද යන මායිම් ඇතුළත එකී අංක 151 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහකුත් දශම හය (අ. 0, රූ. 0, පර්. 12.6) බිම් ප්‍රමාණයෙන් යුතු ඉඩම වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙයට බලයලත් මිනින්දෝරු එච්. දේවසුරේන්ද්‍ර විසින් මැන සකස් කළ අංක 151 හා 1994 ජූනි මස 02 වැනි දින දරන පිඹුරේ ලොට් සී දරන බිම් කට්ටිය මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

03-450

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ශූ. විජේරත්න විසින් ලියා සහතික කරන ලද අංක 104 සහ 2005 මාර්තු මස 10 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම අනුරාධපුරයේ, කොඩිතුවක්කු ආරච්චිගේ සමරවීර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 මැයි මස 31 වැනි දිනට ඉහත කී උකස් බැඳුම්කරය මත එකී කොඩිතුවක්කු ආරච්චිගේ සමරවීර යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් විසිඅටලක්ෂ අනූඑක්දහස් එකසිය එකොළහකුත් ශත අසූනවයක් (රු. 28,91,111.89) මුදලක් සහ 2009 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එම රුපියල් විසිඅටලක්ෂ අනූඑක්දහස් එකසිය එකොළහකුත් ශත අසූනවයක් (රු. 28,91,111.89) මුදල සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් විසිඅටලක්ෂ අනූඑක්දහස් එකසිය එකොළහකුත් ශත අසූනවයක් (රු. 28,91,111.89) මුදලක් සහ 2009 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එම රුපියල් විසිඅටලක්ෂ අනූඑක්දහස් එකසිය එකොළහකුත් ශත අසූනවයක් (රු. 28,91,111.89) මුදල සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ව්‍යාපාරික බඩුතොග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 104 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ව්‍යාපාරයේ ව්‍යාපාරික බඩුතොග සහ එහි වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 104 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර පොතානෙගම, දෙකේ කණුව යන ස්ථානයේ, "සමරවීර සුපර්මාර්කට්" ඇතුළත සහ එහි දැනට තබා තිබෙන,

01. සිගරැට්
02. කේක්
03. දුරකථන කාඩ්පත්

04. තැගි භාණ්ඩ සහ සාප්පු බඩු
05. සහල්
06. කිරි පිටි
07. සබන්
08. සුවඳ විලවුන්, පුයර යනාදිය
09. මස් සහ මාළු
10. වෙනත් ආහාර ද්‍රව්‍ය

සියල්ල ඇතුලුව බන්ධනදායීන්ගේ ව්‍යාපාරය කරගෙන යන හෝ මින් මතු යම් අවස්ථාවක හෝ කලින් කල බන්ධනදායීගේ ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් යම් ගුදම්, ගබඩා සහ පරිශ්‍ර තුළ හෝ පරිශ්‍ර මත තබා තිබෙන, නැතහොත් මෙය බලාත්මකව පවත්නා කාලය ඇතුළත හෝ මතු ඕනෑම අවස්ථාවක හෝ කලින් කල බන්ධනදායී විසින් තම ව්‍යාපාර බඩුතොග බඩුබාහිරාදිය සහ දේවල්, අමුද්‍රව්‍ය, කරගෙන යමින් පවතින වැඩ, නිමි භාණ්ඩ හා නොනිමි භාණ්ඩ සහ වෙනත් සියලු අයිතම සහ දේවල් සහ කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක වෙනත් චංචල දේපළ ගෙනැවිත් තබන හෝ දමා තිබෙන ගුදම්, ගබඩා හා පරිශ්‍රවල සහ මෙය බලාත්මකව පවතින කාලය ඇතුළත මින් ඉදිරියට බන්ධනදායී විසින් කවර හෝ අවස්ථාවක හා කලින් කල සිය ව්‍යාපාරය හෝ කර්මාන්තය ඉවත් කරගෙන ගොස් පවත්වාගෙන යන වෙනත් සියලු ස්ථානවල හෝ යම් ස්ථානයක තිබෙන හෝ බන්ධදායීගේ ව්‍යාපාර බඩුතොග, වෙළෙඳ ද්‍රව්‍ය සහ බඩු බාහිරාදිය හා වෙනත් චංචල දේපළ ගබඩා කර තබනු ලබන සියලු ස්ථානවල හෝ යම් ස්ථානයක තිබෙන, සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත් චංචල දේපල යනාදියෙන් සමන්විත, බන්ධනදායීගේ සියලු හා එක් එක් ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය, බඩුබාහිරාදිය, අමුද්‍රව්‍ය, කරගෙන යමින් පවතින වැඩ, නිමි හෝ නොනිමි භාණ්ඩ, සහ වෙනත් සියලු අයිතම හා වෙනත් කවර වූ හෝ වර්ගයක හෝ ස්වභාවයක දේවල් සහ චංචල දේපළ ද වේ. මෙයට ඉහත සඳහන් ගුදම්, ගබඩා සහ පරිශ්‍ර හෝ ව්‍යාපාරික ස්ථානයක හෝ ඒ ගුදම්, ගබඩා යනාදියක සිට ප්‍රවාහනයේ පවතින හෝ නැව්ගත කිරීම හෝ නිෂ්කාශනය පොරොත්තුවෙන් එකී ජනරජයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාප්පුවක හෝ ගබඩා ගෙයක රඳවා තිබෙන ඉහත සඳහන් පරිදි වූ සියලු දේපළ.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

03-451

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එල්. ආර්. එම්. කොලොන්නෙ සහ එස්. කේ. තුරුසිංහ.
ගිණුම් අංකය : 1063 5321 5761.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මාර්තු මස 09 දාතම හා අංක 1938 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලසන්තා රේඛා මල්ප්‍රභා කොලොන්නෙ සහ සංජීව් කලදේව තුරුසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් හා ලසන්තා රේඛා මල්ප්‍රභා කොලොන්නෙ උකස්කරු වශයෙන් පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නමලක්ෂ හාර දහස් හාරසිය හතලිස් පහයි ශත හැත්තෑහයක (රු. 9,04,445.76) මුදලක් 2009 දෙසැම්බර් මස 17 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් නමලක්ෂ හාර දහස් හාරසිය හතලිස් පහයි ශත හැත්තෑහයක ()රු. 9,04,445.76) මුදලද 2009 දෙසැම්බර් 18 දින සිට අංක 1938 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අටලක්ෂ දහතුන් දහස් එකසිය විස්සයි ශත අසූ හතරක (රු. 8,13,120.84) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1938 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ කලල්ගොඩ ග්‍රාමයේ කලල්ගොඩ පාරේ පිහිටි "කොස්ගහවත්ත නොහොත් දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. පී. ඔකඳපොල යන අය විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 15 දාතම හා අංක 359/2003 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර, නැගෙනහිරට : අංක 5424 දරන පිඹුරේ ලොට් බී51බී, දකුණට : අංක 408 දරන පිඹුරේ ලොට් බී සහ අංක 210 දරන පිඹුරේ ලොට් 11 සහ බස්නාහිරට : අංක 3693 දරන පිඹුරේ ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0. රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමඟ එකී අංක 359/2003 දරන පිඹුරට අනුව ය.

ලොට් ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉහත ඉඩම් කොටස පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කලල්ගොඩ ග්‍රාමයේ කලල්ගොඩ පාරේ පිහිටි "කොස්ගහවත්ත නොහොත් දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ජී. ජී. පියසේන යන අය විසින් සාදන ලද 1995 ජූනි 11 (වඩා නිවැරදිව 1995 ජූනි මස 16) දාතම හා අංක 408 දරන මිණුම් පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන්

ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර, නැගෙනහිරට : අංක 5424 දරන පිඹුරේ ලොට් බී51බී, දකුණට : අංක 408 දරන පිඹුරේ ලොට් බී සහ අංක 210 දරන පිඹුරේ ලොට් 11 සහ බස්නාහිරට : අංක 3693 දරන පිඹුරේ ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 9.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතින් ද වෙනත් අයිතීන් ද. වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 408 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ජී 1130/194 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/6

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඒ. ආර්. එෆ්. විජයසේකර සහ එන්. ටී. ටී. විජයසේකර.
ගිණුම් අංකය : 0031 5001 7032.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එන්. එස්. කලන්සූරිය යන අය විසින් ලියා සහතික කරන ලද 2006 මැයි මස 08 දාතම හා අංක 207 දරන හා සී. ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2008 සැප්තැම්බර් මස 11 දාතම හා අංක 916 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇන්ටන් රන්ජන් ෆ්‍රැන්ක් විජයසේකර සහ නිමාලි තෙරේසා වර්ජිනියා විජයසේකර යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි තිස් දෙලක්ෂ විසි දෙදහස් හයසිය විස්සයි ශත හතලිස් නමයක (රු. 2,32,22,620.49) මුදලක් 2009 දෙසැම්බර් මස 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි තිස් දෙලක්ෂ විසි දෙදහස් හයසිය විස්සයි ශත හතලිස් නමයක (රු. 2,32,22,620.49) මුදල ද 2009 දෙසැම්බර් 03 දින සිට අංක 207 සහ 916 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූඅට ලක්ෂ දසදහස් දෙසිය දහහතයි ශත විසි පහක (රු. 88,10,217.25) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) හා තවත් රුපියල් එක්කෝටි විසිනම ලක්ෂ හතලිස් හය දහස් හත්සිය හතලිහයි ශත හතලිස් දෙකක (රු. 1,29,46,740.42) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 207 සහ 916 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි , 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ උතුරු රත්මලාන වෝඩ් අංක 20හි පිහිටි ටෙම්ප්ලර්ස් ඇවනිව් වරිපනම් අංක 05 දරන "මවුන්ට් අත්තිඩිය නොහොත් ටෙම්ප්ලර්ස් එස්ටේට්" යනුවෙන් කලින් හැඳින්වූ රත්මලාන එස්ටේට් (කොටසක්) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ආර්. ජයසුන්දර යන අය විසින් සාදන ලද 2001 ජුනි 21 දාතම හා අංක 2127 දර පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1, 2, 3 සහ 4 (එකට පිහිටා ඇත) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 7ඒ සහ 9 දරන පරිශ්‍රයන් සහ 9 ගුණවර්ධන මාවත, නැගෙනහිරට : ටෙම්ප්ලර්ස් මාවත වරිපනම් අංක 7/1 සහ 7 දරන පරිශ්‍රයන්, දකුණට : ටෙම්ප්ලර්ස් මාවත සහ බස්නාහිරට : ටෙම්ප්ලර්ස් මාවත වරිපනම් අංක 3 සහ 3/2 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 39.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2127 දරන එකී පිඹුරට අනුව ය.

මෑත මිනුමකට අනුව එකී ලොට් 1, 2, 3 සහ 4 පහතින් විස්තර කොට ඇත :

එකී උතුරු රත්මලාන වෝඩ් අංක 20හි පිහිටි ටෙම්ප්ලර්ස් ඇවනිව් වරිපනම් අංක 05 දරන "මවුන්ට් අත්තිඩිය නොහොත් ටෙම්ප්ලර්ස් එස්ටේට්" යනුවෙන් කලින් හැඳින්වූ රත්මලාන එස්ටේට් (කොටසක්) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ජී. නසූර් යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 27 දාතම හා අංක 6018 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 7ඒ සහ 9 දරන පරිශ්‍රයන් සහ මේජර් ගුණවර්ධන මාවත, නැගෙනහිරට : ටෙම්ප්ලර්ස් මාවත වරිපනම් අංක 7/1 සහ 7 දරන පරිශ්‍රයන්, දකුණට : ටෙම්ප්ලර්ස් මාවත සහ බස්නාහිරට : ටෙම්ප්ලර්ස් මාවත වරිපනම් අංක 3 සහ 3/2 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 39.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6018 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එම් 2951/246 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/5

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එල්. සී. ඩී. විජේවර්ධන සහ එල්. ඒ. කේ. විජේවර්ධන.
ගිණුම් අංක : 1069 5301 8015.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ආර්. සේනානායක යන අය විසින් ලියා සහතික කරන ලද 2004 නොවැම්බර් මස 11 දාතම හා අංක 661 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ලේකම්ලාගේ වමත් දෙනුවන් විජේවර්ධන සහ ලේකම්ලාගේ අජන්තා කුමාරි විජේවර්ධන යන අය බන්ධනදායීන් වශයෙන් හා ලේකම්ලාගේ වමත් දෙනුවන් විජේවර්ධන උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස්එක් ලක්ෂ පනස්එක් දහස් විස්සයි ශත අසූ අටක (රු. 31,51,020.88) මුදලක් 2009 දෙසැම්බර් මස 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්එක් ලක්ෂ පනස්එක් දහස් විස්සයි ශත අසූ අටක (රු. 31,51,020.88) මුදලද 2009 දෙසැම්බර් 04 දින සිට අංක 661 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිඅට ලක්ෂ පන්දහස් නමයයි ශත හතලිස් අටක (රු. 28,05,009.48) මුදල සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 661 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි , 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හෝමාගම පිහිටි "ගලගාවලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 2005 ජනවාරි මස 31 දාතම හා අංක 4737 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 3468 දරන පිඹුරේ ලොට් බී, නැගෙනහිරට : පාර (ප්‍රධාන), දකුණට : ලොට් 2, 5 සහ ඩී1 සහ බස්නාහිරට : ලොට් ඩී1 සහ අබරන් පෙරේරා සහ වෙනත් අයගේ කුඹුර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසිහතයි දශම පහක් (අ. 0, රූ. 2, පර්. 27.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේත් සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4737 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ජී 1562/201 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ සහ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1562/202 යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 4737 දරන පිඹුරේ ලොට් 04

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1562/203 යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 4737 දරන පිඹුරේ ලොට් 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/4

---

පීවී 60921.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " මහජන ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.08.06 දින සංස්ථාපිත සමාගමක් වන මහජන ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, මහජන ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-437

---

පීවී 61786.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ඩිකෝන් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.10.23 දින සංස්ථාපිත සමාගමක් වන ඩිකෝන් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්

ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඩිකෝන් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-441

---

පීබී 3333.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " බ්‍රැන්ඩික්ස් එකෝ සෝන් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.12.19 දින සංස්ථාපිත සමාගමක් වන බ්‍රැන්ඩික්ස් එකෝ සෝන් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, බ්‍රැන්ඩික්ස් එකෝ සෝන් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-442

---

පීවී 62141.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " අවෙන් ටෙලිකොම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.11.26 දින සංස්ථාපිත සමාගමක් වන අවෙන් ටෙලිකොම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, අවෙන් ටෙලිකොම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-439

---

පීවී 63513.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " එස් සී එස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.03.19 දින සංස්ථාපිත සමාගමක් වන එස් සී එස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, එස් සී එස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-438

---

පීවී61847.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ඔරෙගානෝ රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.10.31 දින සංස්ථාපිත සමාගමක් වන ඔරෙගානෝ රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඔරෙගානෝ රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-440

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අළුත්ගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

තෙන්කුට්ටි දුමිදු ෂෙමාල් සිල්වා.

2010.01.07 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.12.12 දින හා අංක 2204 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, තෙන්කුට්ටි දුමිදු ෂෙමාල් සිල්වා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහය ලක්ෂ අනූපන්දහස් තුන්සිය තිස්පහයි ශත හැටක (රු. 26,95,335.60) මුදලක් 2009.10.20 වැනි දින සිට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 26,95,335.60 ක මුදලට 2009.10.21 වැනි දින වන විට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2204 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු තොටමුනේ, කළුතර අළුත්ගම බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවට අයත් මාලෙවන් බැද්දේ උප කාර්යාලය තුළ කලවිල, කළුවාමෝදරහි පිහිටි "කලවිලවත්ත" නමැති ඉඩමට බලයලත් මානක වයි.එම්. පී. බී. කරුණාසුන්දර විසින් මැන සාදන ලද අංක 291 සහ 1975 ඔක්තෝබර් මස 08 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 8" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පිඹුරු අංක 291 ට අයත් ලොට් 14 (අඩි 15ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද කොටස) ද ; නැගෙනහිරට : පිඹුරු අංක 291ට අයත් ලොට් 11 න් ද ; දකුණට : පිඹුරු අංක 291 ට අයත් ලොට් 7 සහ 12 න් ද සහ බස්නාහිර පිඹුරු අංක 291 ට අයත් ලොට් 3 සහ 4 න්ද මායිම් වූ එකී අංක 291 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල ඉඩම තුල ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 52/259 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක එච්. පී. ද එස්. තාබ්‍රෙව් විසින් මැන සාදන ලද අංක 903 සහ 2002 සැප්තැම්බර් මස 19 වැනි දින දරන පිඹුරට අයත් ඉඩම නැවත මැනීමකට ලක් කිරීමෙන් අනතුරුව මෙසේ විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු තොටමුණේ, කළුතර අළුත්ගම බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවට අයත් මාලෙවන් බැද්දේ උප කාර්යාලය තුළ කලවිල, කළුවාමෝදරහි පිහිටි "කලවිලවත්ත" නමැති ඉඩම අංක 903 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 8" ලෙස ලකුණු කර ඇති ඉඩමේ කොටසට මායිම් උතුරට : ලොට් 14 (අඩි 15ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද කොටස) ද ; නැගෙනහිරට : ලොට් 11 න් ද ; දකුණට : ලොට් 7 සහ 12 න් ද සහ බස්නාහිරට : ලොට් 3 සහ 4 න් ද මායිම් වූ එකී අංක 903 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම තුල ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ.

අංක 2204 දරන බැඳුම්කරයේ ලකුණු කර ඇති දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03-470/1

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2009 මැයි 5 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 2002.01.17 දිනැති අංක. 1649 දරන බැඳුම්කරය සහ කොළඹ මහජන නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2007.02.27 දිනැති අංක 47 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.02.29 දින තෙක් පොලිය ද, කාලීන ණය (A) මත රුපියල් හැටතුන් ලක්ෂ හතලිස් හයදහස් දෙසීය දාසයයි ශත පනස් එකක් (රු.63,46,216.51)

සහ කාලීන ණය (B) මත රුපියල් දසලක්ෂ හත්දහස් විසිපහයි ශත විසිඑකක් (රු.10,07,025.21) ද, ඒ සමග කාලීන ණය (A) මත රුපියල් පනස් දෙලක්ෂ හැත්තෑ දහස් දෙසීය පහයි ශත අසූතුනක් (රු.52,70,205.83) මත වසරකට සියයට විසිහතරයි දශම පහ (24.5%) බැගින් තවදුරටත් පොලියක් ද, කාලීන ණය (B) මත රුපියල් නවලක්ෂ හතලිස් හයදහස් හාරසීය හැත්තෑඑකයි ශත පනස් එකක් (රු.9,46,471.51) මත වසරකට සියයට පහ (5%) බැගින් තවදුරටත් පොලියක්ද ගෙවීම නිම කරන දිනය තෙක් කැළණිය, ගෝනවල, පට්ටිවිල, බියගම පාරේ, අංක 87 හි එල්. ආර්. මදුරප්පිුය ගෙන් අයවිය යුතුව ඇත.

2. එකී බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හැත්තෑතුන්ලක්ෂ පනස්තුන් දහස් අටසිය හතලිස් එකයි ශත හැත්තෑ දෙකක (රු.73,53,841.72) මුදල සමග 2008.03.01 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, වසරකට සියයට විසිහතරයි දශම පහක් (24.5%) සහ වසරකට සියයට පහ (5%) බැගින් වූ පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහතුන් වෙත එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට පිටකොටුව ලංකා බැංකු ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම් හා විගණන) ට ද, මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේපත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ බොරලැස්ගමුව උප කාර්යාල, බොරලැස්ගමුවෙහි පිහිටි බොරලැස්ගමුව පිටවල පාරේ, වරිපනම් අංක 34 දරන කඩොලකුඹුර නැතහොත් මහකැරැව්වකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද 1998 ජුනි 18 දිනැති අංක 2775 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 1 ඊසානදිගට : ලොට් 65 (පාරට වෙන්කළ කොටස) ගිනිකොණට : ලොට් 10 හි කොටසක් සහ ලොට් 11 ද, නිරිතට : ලොට් 2 ද, වයඹට : ලොට් 64 (අඩි 12 පළල පාරට වෙන් කළ කොටස) ද මායිම්ව එකී අංක. 2775 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයයි දශම එකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 9.10) වපසරියකින් යුක්තවන අතර, එහි ඇති සියළු දේද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2437/214 හි ද, දැනට නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේද ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

ඉහත කී බොරලැස්ගමුවෙහි පිහිටි කඩොලකුඹුර නැතහොත් මහකැරැව්වකුඹුර නමැති ඉඩමෙහි අංක 2775 දරන පිඹුරෙහි ලොට් 65 ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල ඊසාන දිගට : අබේරත්න මාවතද, ගිනිකොණට : අංක 538 දරන පිඹුරෙහි ලොට් E ද, නිරිතට : ලොට් 1, 11, 63, 12, 23, 62, 24, 33, 61. 34, 43, 60, 44, 53, 52 සහ 54 ද, වයඹට : ලොට් 64 (අඩි 12 පළල පාරට වෙන් කළ කොටස) ද, මායිම්ව අංක 2775 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20.00) වපසරියකින් යුක්ත වන අතර, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1617/287 ද, දැනට නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහතකී බොරලැස්ගමුවෙහි පිහිටි කඩොලකුඹුර නැතහොත් මහකැරැව්වකුඹුර නමැති ඉඩමෙහි අංක 2775 දරන එකී පිඹුරෙහි ලොට් 64 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කර නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල ඊසාන දිගට : අබේරත්න මාවත ද, ගිනිකොණට : ලොට් 1 සිට 5 දක්වා ද, නිරිතට : වැකන්දට වෙන්කළ කොටස ද, වයඹට : වැකන්දට වෙන් කළ කොටස ද, මායිම්ව එකී අංක 2775 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 17.25) වපසරියකින් යුක්ත වන අතර, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1617/288 යටතේද දැනට නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ද ලියාපදිංචි කර ඇත.

එස්. වී. කේ. හේමසිරි,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අයකරගැනීම් හා විගණන.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
ගෑස් කර්මාන්ත වීදිය,
පිටකොටුව.

03-485

---

පීවී 60488.

### 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ “ ජයන්ත් ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්” හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.06.29 දින සංස්ථාපිත සමාගමක් වන ජයන්ත් ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ජයන්ත් ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

03-443

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩී. එස්. එස්. කුමාර.
ගිණුම් අංක : 0061 5000 5696.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පිඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රම්‍යා අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු 31 දාතම හා අංක 2218 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙව්පුර සුනිල් ශාන්ත කුමාර යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් දෙලක්ෂ විසි දෙදහස් නමසිය පහළවයි ශත දහනමයක (රු. 32,22,915.19) මුදලක් 2009 දෙසැම්බර් 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස් දෙලක්ෂ විසි දෙදහස් නමසිය පහළවයි ශත දහනමයක (රු.32,22,915.19) මුදල ද 2009 දෙසැම්බර් 15 වැනි දින සිට අංක 2218 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි නම ලක්ෂ හැත්තෑ හතර දහස් හාරසීය පනස් දෙකයි ශත පනස් හතක (රු. 29,74,452.57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2218 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පෝරේ ග්‍රාමයේ පිහිටි "ඉඳුරුපතෙලදෙණිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. කේ. මහින්ද යන අය විසින් සාදන ලද 2007 මැයි 02 දාතම හා අංක 3096 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 255/389 දරන පිඹුරේ ලොට් ඒ සහ අගල් කානුව නැගෙනහිරට : එච්. එස්. පෙරේරා යන අයගේ ඉඩම දකුණට : එච්. එස්. පෙරේරා යන අයගේ ඉඩම සහ පාර (H) සහ බස්නාහිරට : අංක 255/389 දරන පිඹුරේ ලොට් ඒ යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම පහයි බිංදුවක් (අක්. 0, රූඩ් 0, පර්. 6.50) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3096 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ජී 495/231 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහත මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී පෝරේ ග්‍රාමයේ පිහිටි "ඉඳුරුපතෙලදෙණිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ඩී. රාමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 1977 පෙබරවාරි 15 දාතම හා අංක 255/389 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මර්තේලිස් අප්පුහාමි යන අයගේ ඉඩම සහ දේපළ නැගෙනහිරට : එච්. එස්. පෙරේරා යන අයගේ ඉඩම දකුණට : බොරැල්ල සිට අතුරුගිරිය දක්වා පාර සහ බස්නාහිරට : ලොට් ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම පහයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 6.50) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, සමග එකී අංක. 255/389 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/9

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ජේ. ආර්. එම්. එන්. කේ. අමරසිංහ සහ එස්. එච්. ගොඩගම.
ගිණුම් අංක : 1064 5320 3363.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඒ. රත්නායක යන අය විසින් ලියා සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 29 දාතම හා අංක 269 දරන හා 2007 දෙසැම්බර් 14 දාතම හා අංක 484 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට එහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජයවර්ධන රූපසිංහ මුදියන්සේලාගේ නයනානන්ද කුමාර අමරසිංහ සහ ශ්‍යාමා හේමමාලි ගොඩගම යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී ජයවර්ධන රූපසිංහ මුදියන්සේලාගේ නයනානන්ද කුමාර අමරසිංහ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් ලක්ෂ හැට දහස් පන්සිය පනස් තුනයි ශත හැට අටක (රු. 11,60,553.68) මුදලක් 2009 දෙසැම්බර් 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එකොලොස් ලක්ෂ හැට දහස් පන්සිය පනස් තුනයි ශත හැට අටක (රු. 11,60,553.68) මුදල ද 2009 දෙසැම්බර් 12 වැනි දින සිට අංක 269 සහ 484 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් හයලක්ෂ අසූඅට දහස් හයසිය අනූ හතරයි ශත තිස් හතක (රු. 6,88,694.37) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහලොවක් (15%) හා තවත් රුපියල් දෙලක්ෂ අනූ දෙදහස් හයසිය අනූ හතරයි ශත හැට හයක (රු.2,92,694.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 269 සහ 484 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛණයේ මැනවින් විස්තර

කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ ගන්දොලහ පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුල කහගොල්ල ග්‍රාමයේ පිහිටි "බදුගේවත්ත සහ දෙල්ගහමුලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. සී. පී. ගුණසේන යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් 05 දාතම හා අංක 2522 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1762 දරන පිඹුරේ ලොට් 1 නැගෙනහිරට : අංක 1762 දරන පිඹුරේ ලොට් 1 දකුණට : උඩහවත්ත සහ ඉඹුල්පරේවත්ත සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් තුනයි දශම හයක් (අක් 0, රූඩ්. 1, පර් 33.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක. 2522 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 1213/90 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩම නැවත මිනුමකි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ ගන්දොලහ පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුල කහගොල්ල ග්‍රාමයේ පිහිටි "බදුගේවත්ත සහ දෙල්ගහමුලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ලියනගේ යන අය විසින් සාදන ලද 1966 අගෝස්තු 31 දාතම හා අංක 1762 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එකී පිඹුරේ ලොට් 1 නැගෙනහිරට : උඩහවත්ත දකුණට : ඉඹුල්පරේවත්ත සහ බස්නාහිරට : මහ අරඹ සහ අඩි පාර යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම එකයි දෙකයි පහක් (අක් 0, රූඩ්. 0, පර්. 36.125) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක. 1762 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 641/202 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-482/10

පීවී 60978

---

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ “ ද බෑන් (ප්‍රයිවට්) ලිමිටඩ්” හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.08.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන ද බෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ද බෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

03-445

---

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - හලාවත
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඊබ්‍රාහිම් සරුඩීන් කමලඩීන් සහ ෆාතිමා සෆ්නා.

2010.01.07 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. එස්. මැදගොඩ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2006.01.17 වැනි දින සහ අංක 6916 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඊබ්‍රාහිම් සරුඩීන් කමලඩීන් සහ ෆාතිමා සෆ්නා ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස්ලක්ෂ විසිහයදහස් නවසිය විස්සයි ශත පනස්තුන (රු.11,26,920.53) ක මුදලක් 2009.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු.11,26,920.53 ක මුදලට 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 6916 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරන මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුල උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, පහල ඔලිදළුවෙහි පිහිටි "තල්ගහ ගල සහ පට්ටියවේලි මාරතී මාරකඩ

ගලක්කානි" නමැති ඉඩමට බලයලත් මානක ඩී. පී. විමලසේන විසින් මැන සාදන ලද අංක 2151 සහ 1996 ඔක්තෝබර් මස 29 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : එච්. එල්. ඩී. ජෝසප් ගුණවර්ධනට අයත් ඉඩමෙන් ද නැගෙනහිරට : ලොට් 2 සහ (මීටර් 3 ක පළල හලාවත සිට කොළඹ දක්වා දිවෙන අධිවේගී මාර්ගය) පිඹුරු අංක 2151 ට අයත් ලොට් 3 න් ද දකුණට : එම්. එල්. ඩී. පෙරේරාට සහ අනෙක් අයට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : එම්. එල්. ඩී. පෙරේරාට සහ අනෙක් අයට අයත් ඉඩමෙන් ද මායිම් වූ රූඩ් එකයි (අ. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි එකයි දෙක (හෙක්. 0.1012) ක විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ අනිකුත් සියළුම දේත් සමග හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 180/21 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී 2151 දරන පිඹුරේ නැගෙනහිර මායිම් ලොට් 3 දරන (මීටර් 3 පළලැති පාර) පොදු ප්‍රවේශ මාර්ගය හලාවත කොළඹ ප්‍රධාන මාර්ගය හා සම්බන්ධිතයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

03-470/4

---

පීවී 60935

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ටැන්රා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.08.07 වැනි දින සංස්ථාපිත සමාගමක් වන ටැන්රා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ටැන්රා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ක් වූ පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

03-444

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ116 දරන) කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 426904.

විතාරණලාගේ උදයසිරි.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය 2009 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් යෝජනා සම්මත කරන ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. වීරසේකර විසින් වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වශයෙන් හඳුන්වන එකී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමට ලියා සහතික කරන ලද අංක 11956 සහ 2008 පෙබරවාරි මස 15 වැනි දින දරන බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් එහි බන්ධනදායී වශයෙන් හඳුන්වනු ලැබූ විතාරණලාගේ උදයසිරි විසින් පැහැර හැර ඇති බැවින් ද, ඒ අනුව ඉහත කී බැඳුම්කරය මත 2009 අප්‍රේල් මස 30 වැනි දිනට රුපියල් තිස්දෙලක්ෂ දහහතරදහස් හත්සිය හැත්තෑහයකුත් ශත පහක (රුපියල් 3,214,776.05) මුදලක් වර්තමානයේ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී රුපියල් තිස්දෙලක්ෂ දහහතර දහස් හත්සිය හැත්තෑහයකුත් ශත පහක (රුපියල් 3,214,776.05) මුදල සහ රුපියල් විසිහත්ලක්ෂ අසූහයදාස් තුන්සිය තිස්හතකුත් ශත තිස්දෙකක (රුපියල් 2,786,337.32) මුදල මත 2009 මැයි මස 01 වැනිදා සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21.5% බැගින් තවදුරටත් පොළිය ද ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවා ඇති, යම් මුදලක් වෙතොත්, එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 11956 දරන බැඳුම්කරය මත ඉහත කී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකසට තබා ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, අළුත්කඩේ වීදියේ අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද, පින්වත්තෙහි පිහිටි හික්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් මැන සාදන ලද අංක 3385 සහ 1998 ඔක්තෝම්බර් මස 20 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 27 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : ලොට් 25 ද නැගෙනහිරට: ලොට් 43 ද, දකුණට : ලොට් 44 ද, බස්නාහිරට : ලොට් 26 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයකුත් දශම දෙකක (අ. 0, රූ. 0. පර්. 10.2) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති පස්, ගහකොළ පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමගය. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 365/243 යටතේ ලියාපදිංචි කර ඇත.

ත වද ඉහත කී ඉඩමට පහත සඳහන් කරන ඉඩම් මතින් ඇති මාර්ගයේ සහ පටුමගේ සෑම විටකදී ම සහ සියලුම කාර්ය සඳහා බඩු පටවාගෙන හෝ බඩු පටවානොගෙන අශ්වයින්, ගවයින් සහ වෙනත් සතුන්, මෝටර් රථ, ලොරි හෝ වෙනත් වාහන වලින් හෝ තොරව ගමන් කිරීමට, ආපසු

පැමිණීමට, පසුකර යාමට පොදු අයිතිය, නිදහස සහ බලය ද සහ ඒ ඉඩම් දිගේ සහ ඒ ඉඩම් මතින් විදුලි කේබල, රැහැන් ඇදීම, එළීම ජලපවහන හෝ ජල නල එළීම ආදී කටයුතු සඳහා යොදාගැනීම ද සමගය.

(1) ඉහත කී පින්වත්තේ පිහිටි හික්ගහවත්ත නමැති ඉඩමට සාදන ලද අංක 3385 පිඹුර ප්‍රකාර ලොට් 43 වශයෙන් නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 17 ද, නැගෙනහිරට : ලොට් 17, 21, 40, 24, 28, 45 සහ 33 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් 34, 35, 44, 27, 25, 19 සහ 18 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3385 දරන පිඹුර අනුව රූඩ් පහළොවකුත් පර්චස් දෙකක් (අ. 0, රූ. 15, පර්. 2) විශාල බිම් කැබැල්ල ය. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 354/293 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) ඉහත කී පින්වත්තේ පිහිටි හික්ගහවත්ත නමැති ඉඩමට මැන සාදන ලද අංක 3385 දරන පිඹුර ප්‍රකාර ලොට් 44 වශයෙන් නිරූපිත බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : ලොට් 27 ද, නැගෙනහිරට : ලොට් 43 ද, දකුණට : ලොට් 35 සහ 36 ද, බස්නාහිරට : ලොට් 26 ද යන මායිම් තුළ පිහිටි ඉහතකී අංක 3385 දරන පිඹුර අනුව පර්චස් දෙකයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 2.3) විශාල බිම් කැබැල්ලය. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 365/242 යටතේ ලියාපදිංචි කර ඇත.

(3) තවද බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් මැන සාදන ලද අංක 3385 සහ 1998 ඔක්තෝබර් මස 20 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 37,40, 45, 41, 42 සහ 39 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිවාසිකම් සහ වෙනත් සියලු මාර්ග අයිතිවාසිකම් ද සමගය.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

03-477

---

## සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0170 - 117360 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.12.10 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පරමසෝදි විසින් සියල්ලම සහතික කරන ලද 2003 සැප්තැම්බර් මස 29 දිනැති අංක 1224, 2004 නොවැම්බර් 18 දිනැති අංක 1694 සහ 2006 අප්‍රේල් 26 දිනැති අංක 2234 දරන බැඳුම්කරය මත අයවිය මුදල් ගෙවීම, තෙල්දෙනිය, ''විමල ඒජන්සීස් '' යන නාමය, විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයේ පවත්වා ගෙන යන කැන්දගොල්ලේගෙදර ලලිත් කුමාර ප්‍රේමසිරි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස්හතර ලක්ෂ අසූදෙදහස් තුන්සිය දහයයි ශත අසූදෙකක (රු. 54,82,310.82 ) මුදලක්, 2009 සැප්තැම්බර් 28 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 54,82,310.82 මුදල ද, 2009 සැප්තැම්බර් 29 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයට සියයට තිස් පහක (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම් ) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1224, 1694 සහ 2234 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර පාලිස්පත්තු නැගෙනහිර කෝරළේ, කරලියද්ද මදගම්මැද්ද පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 2000 අප්‍රේල් 25 දිනැති අංක 7853 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකනෑගෙදර වත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන්කරන ලද යාබද ඉඩම් කොටසට මායිම්, උතුරට: වයි.එම්. බිසෝමැණිකාට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස ද; නැගෙනහිරට : තෙල්දෙනියේ සිට මහනුවර දක්වා මහා මාර්ගය ද ; දකුණට : කේ. එම්. එන්. කුලසේකර සහ යාපාරත්නට අයිති ඉඩම ද ; වයඹට : වයි. එම්. බිසෝමැණිකාට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස සහ නිමල් විජේකෝන්ගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7 ) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති

03-459 /3

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කොට්ටාව ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0330-30310683-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පෙරේරා විසින් සහතික කරන ලද 2008 නොවැම්බර් මස 21 දිනැති අංක 599 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රාගම පදිංචි අහංගම දලුවත්තගේ චාන්දනී යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ පනස් අටදහස් අසූඅටයි ශත විසි එකක (රු. 7,58,088.21) මුදලක් 2009 අගෝස්තු 27 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 7,58,088.21 මුදල ද, 2009 අගෝස්තු 28 වැනි දින වන සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයට සියයට තිස් දෙකක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම් ) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 599 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ උඩසිය පත්තුවේ බණ්ඩාරපොල පිහිටි බලයලත් මිනින්දෝරු ජේ.ඩබ්ලිව්. ජයසේකර විසින් සාදන ලද 1990 අගෝස්තු 05 දිනැති අංක 4060 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බණ්ඩාරපොල ගෘප් හි ගොඩපොල ඩිවිෂන් හි ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: මෙම ඉඩමේ කොටස ද ; නැගෙනහිරට : බණ්ඩාරපොල ගෘප් හි මුවන්දෙණිය කොටස ද ; දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට: ප්‍රධාන පාරේ සිට මුවන්දෙනියට යන පාර ද යන මායිම් තුළ අක්කර දහ අටක් (අ. 18, රූ. 0, පර්. 0) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෑතක මැණීමක් අනුව :

මධ්‍යම පළතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ උඩසිය පත්තුවේ බණ්ඩාරපොල පිහිටි බලයලත් මිනින්දෝරු ජේ.එම්. ජයසේකර විසින් සාදන ලද 2008 අගෝස්තු 22 දිනැති අංක 12081 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බණ්ඩාරපොල ගෘප් හි ගොඩපොල ඩිවිෂන් හි ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේ කොටස ද ; නැගෙනහිරට : බණ්ඩාරපොල ගෘප් හි මුවන්දෙනිය කොටස ද : දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට මුවන්දෙනියට යන පාර ද යන මායිම් තුළ එකී අංක 12081 දරන සැලැස්ම අනුව අක්කර දහ අටක් (අ. 18, රූ. 0, පර්. 0 ) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති

03-459 /2

### ලංකා බැංකුව- ග්‍රෑන්ඩ් පාස් ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2010.01.21 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2007.03.27 දිනැති අංක. 3132 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.11.04 වෙනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිපන්ලක්ෂ අසූඑක් දහස් තුන්සිය හතලිස් නවයයි ශත අනූපහක (රු.25,81,349.95) මුදලක් සමග රුපියල් විසිලක්ෂ හැටනවදහස් විසිනවයයි ශත තිස්නවයක (රු.20,69,029.39) මුදලක් මත වසරකට සියයට විස්ස (20%) බැගින් පොළියක් ද, 2009.11.05 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වත්තල, හැඳල, වැලිඅමුණ, අංක 65/38 හි පදිංචි ඩිම්පල් මරිනා ග්‍රේබ් මහත්මියගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 3132 දරන බැඳුම්කරය මත අයවිය යුතුව එකී රුපියල් විසිපන්ලක්ෂ අසූඑක් දහස් තුන්සිය හතලිස් නවයයි ශත අනූපහක (රු.25,81,349.95) මුදල සමග 2009.11.05 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ, ශාඛා කළමනාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ දකුණ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ (බටුවත්ත උපකාර්යාලය) බණ්ඩිගොඩ පිහිටි, පල්ලිය පාරේ, වරිපනම් අංක, 51 සී දරන හැඩවකගහවත්ත සහ ගොඩපරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් සාදන ලද 2006 ජනවාරි 10 දිනැති අංක. 5026 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 උතුරටː ලොට් 2 ද, නැගෙනහිරට ː ප්‍රා. ස. පාර ද, දකුණට ː පාර (පිඹුරු අංක 3961 හි ලොට් 14) ද, බස්නාහිරට ː ලොට් 1 ද, මායිම්ව අංක 5026 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.80) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි හතයි තුනක (හෙක්ටයාර් 0.0273) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියළු දේද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 543/220 හි ලියාපදිංචි කර ඇත.

පී. පී. ජේ. වීරසිංහ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
ග්‍රෑන්ඩ්පාස් ශාඛාව.

03-487

**සෙලාන් බැංකුව පීඑල්සී - බලන්ගොඩ ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.12.10 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංක : 0200-00008088 - 001 සහ 0200-05004074 - 101

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. අබේරත්න විසින් සියල්ලම සහතික කරන ලද 1993 අගෝස්තු 27 දිනැති අංක 1118, 1994 දෙසැම්බර් 3 දිනැති අංක 1291, 1995 දෙසැම්බර් 11 දිනැති අංක 1448, 1998 ජූලි 1 දිනැති අංක 1837, 2000 අගෝස්තු 2 දිනැති අංක 2290 සහ 2003 ජූනි 4 දිනැති අංක 3014 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, බලංගොඩ පදිංචි මාපා මුදියන්සේලාගේ මංජුල කිත්සිරි ගවරම්මාන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිලක්ෂ විසිහය දහස් අටසිය දහසයයි ශත හැත්තෑහයක (රු.20,26,816. 76) මුදලක් 2009 ජූලි 6 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 20,26,816.76) මුදල ද, 2009 ජූලි 07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1118, 1291, 1448, 1837, 2290 සහ 3014 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

1. සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරළේ හෙල උඩ පලාත බලන්ගොඩ නගර සභා සීමාව තුල ගොරක්ගහමඩ කොට්ඨාසයේ මහවලතැන්න පාර දිගේ ගොරක්ගහමඩ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් විසින් සාදන ලද 1987 මාර්තු 3 දිනැති අංක : 1507 දරන සැලැස්මේ ලොට් 1 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර ද, දකුණට : එකී අංක : 1507 දරන සැලැස්මේ ලොට් 2 සහ මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුල පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) ක් විශාල, ගොඩනැගිලි, වගා, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්ඉරුව ඉ. 139/341 යටතේ ලියාපදිංචි කර ඇත.

2. එකී මහවලතැන්න පාර දිගේ ගොරකගහමඩ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් විසින් සාදන ලද 1987 මාර්තු 3 දිනැති අංක : 1507 දරන සැලැස්මේ ලොට් 2 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1507 දරන සැලැස්මේ ලොට් 1 සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර ද, දකුණට : පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුල පර්චස් දහහතක් (අ. 0, රූ. 0, පර්. 17) ක් විශාල, ගොඩනැගිලි, වගා, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්ඉරුව ඉ. 165/243 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති

03-459/4

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 02/03131/ජී2/843.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.16 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ජේ. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2005.12.11 දින හා අංක 513 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, බඩල්ගම පදිංචි නිස්සංක පතිරන්නැහැලාගේ පද්මිනි චන්ද්‍රලතා, කොරතොට ආරච්චිගේ එච්ජිනාහාමි සහ කොරතොට ආරච්චිගේ මැගිනෝනා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.09.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ දාහත්දහස් හයසිය පනස් නවයයි ශත අනූ එක (රු. 5,17,659.91)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 513 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය විසිතුනයි ශත තිස් හත (රු. 223.37) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ බඩල්ගම ගමේ පිහිටි මිල්ලගහවත්ත සී කොටස නමැති ඉඩමේ 1999.06.10 දින බලයලත් මිනින්දෝරු ඩබ්. විතාරණ විසින් බෙදා වෙන්කර සකසන ලද 3473 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 8.91ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 709/232 යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද එකී පිඹුරේ කැබලි අංක 6 මතින් වැටී ඇති මාර්ග අයිතිය ද වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 පෙබරවාරි මස 25 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

03-452/7

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : පීපී/02/01370/ජීඑන්1/114.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.15 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එම්. ඩී. ජයතිලක විසින් සහතික කරන ලද 2002.07.11 වැනි දින හා අංක 1238 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ආඬිඅම්බලම පදිංචි සිංහල පේඩිගේ වසන්තා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.08.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැත්තෑ නවදහස් අටසිය පහළවයි ශත අනූහතර (රු. 79,815.94)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1238 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් එකයි ශත පනස් පහක් (රු. 41.55) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුව, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ මාබෝදල උප කාර්යාලයේ, හොරගස්මුල්ල සහ මාබෝදල පිහිටි මහහේන වත්ත නමැති ඉඩමට 2002.01.22 වැනි දින බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් විසින් මැන සකස් කරන ලද අංක 459 2කේ දරන පිඹුරේ කැබලි අංක 23 බෙදා වෙන් කරන දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15ක් වූ බිම් කොටස වේ.

මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ/292/217-223 යටතේ ලියාපදිංචි කොට ඇත.

තව ද එකී පිඹුරු අංක 459 2කේ හි ප්‍රවේශ මාර්ගය ලෙස දක්වා ඇති කැබලි අංක 33, 34, 35, 36, 37 සහ 38 මතින් ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 පෙබරවාරි මස 25 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

03-452/6

---

ජීජ් 63

### 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ " නැණ උදාන " හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.09.20 වැනි දින සංස්ථාපිත සමාගමක් වන නැණ උදාන ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, නැණ උදාන නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

03-446

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

බෝරුක පවර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0022 1000 2076.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, සෙලාන් බැංකුව පීඑල්සී සහ සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. වී. ජයවර්ධන යන අය විසින් ලියා සහතික කරන ලද පිළිවෙලින් 2005 ජූනි 22, 2005 ජූනි 23, 2005 ජූනි 24 සහ 2005 ජූනි 28 යන සියළුම දාතමයන් හා අංක 382 දරන සහගාමී උකස් බැඳුම්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. වී. ජයවර්ධන යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 13, 2006 ඔක්තෝබර් මස 20, 2006 ඔක්තෝබර් මස 30 සහ 2006 දෙසැම්බර් මස 05 යන සියලුම දාතමයන් හා අංක 445 දරන සහගාමී උකස් බැඳුම්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එන් . වී. ජයවර්ධන, එස්. කුගදරන්, එස්. වී. ඊ. විජේරත්න සහ බී. ඩී. ටී. ධර්මතිලක යන අය විසින් ලියා සහතික කරන ලද පිළිවෙලින් 2007 අගෝස්තු 06, 2007 අගෝස්තු 16, 2007 අගෝස්තු 20 සහ 2003 අගෝස්තු 23 දාතමයන් හා අංක 462/844/2954/1908 සහගාමී උකස් බැඳුම්කර මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කෝට්ටේ මිරිහාන, රජ මහා විහාර පාර, සිරිපුර උද්‍යානය, අංක 168/7, දැන් කොළඹ 05, නුගගහවත්ත පාර, අංක 07 හි ලියාපදිංචි කාර්යාලය සහිතව ශ්‍රී ලංකාවේ සමාගම් නීති යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන බෝරුක පවර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් කෝටි විසි දෙලක්ෂ හැත්තෑ තුන් දහස් හයසිය එකොළහයි ශත පනස් හතක (රු. 1,12, 273,611.57) මුදලක් 2008 නොවැම්බර් මස 24 වැනි දිනට සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එකොලොස් කෝටි විසි දෙලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය එකොළහයි ශත පනස් හතක (රු. 1,12,273,611.57) මුදලද 2008 නොවැම්බර් 25 වැනි දින සිට අංක 382, 445 සහ 462/844/2954/1908 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි හැට ලක්ෂයක (රු.66,000,000) මුදලක් සඳහා සාමාන්‍ය භාර තැන්පතු අනුපාතයට ඉහලින් (above Aveage weighted Deposit Rate) වාර්ෂිකව සියයට පහක් (5%) බැගින් වූ හා තවත් රුපියල් දෙකෝටි අනූ තුන් ලක්ෂ හැත්තෑ දහසක(රු. 29,370,000) මුදලක් සඳහා සාමාන්‍ය භාර ප්‍රධාන ණය දීමේ අනුපාතයට ඉහලින් (above Aveage weighted Prime Lending Rate) වාර්ෂිකව සියයට දෙකයි දශම පහක් (2.5%) බගින් වූ වාර්ෂිකව සියයට විසි හතරක (24%) උපරිමයකට යටත්ව පොළිය ද, දැන්වීම්ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 382, 445 සහ 462/844/2954/1908 දරන එකී සහගාමී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

*උපලේඛනය*

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ කඩුපිට පත්තුවේ ලහුපනේ ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන සහ තලම්තිකරු එම්. පී. ජයලත් කුමාර යන අය විසින් සාදන ලද 2003 ජනවාරි 01 දාතම හා අංක 1317 දරන පිඹුරේ නිරූපිත හුණුගලවත්ත යයි කියනු ලබන ඉඩමේ කොටසක් සහ පෙනවලගාවවත්ත නොහොත් හේන යයි කියනු ලබන ඉඩම් කොටසේ ඒකාබද්ධයක් වන ලොට් 16 වශයෙන් ලකුණු කොට ඇති, ඒ මත සියළුම නිදහස් හා රිසි අයිතින් ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගුරුගොඩ ඔය, නැගෙනහිරට : ඇල සහ පැලඉණි වැට, දකුණට : හාරිගල සිට මොරන්තොට දක්වා පාර (මහා මාර්ගය) සහ බස්නාහිරට : පැලඉණි වැට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහ හතක් (අ. 0, රූ. 2, පර්. 17) විශාල ඉඩම් කොටස සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1317 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 1145/158 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී ලහුපනේ ග්‍රාමයේ පිහිටි හුණුගලවත්ත යයි කියනු ලබන ඉඩමේ කොටසක් සහ පෙනවලගාවවත්ත නොහොත් හේන යයි කියනු ලබන ඉඩමට අංක 1317 දරන පිඹුරේ නිරූපිත ලොට් 9 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියළුම නිදහස් හා රිසි අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට නැගෙනහිරට හා දකුණට : හුණුගල් වත්තයයි කියනු ලබන ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : ලොට් 10 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් හතරයි දශම නමයයි අටක් (අ. 0, රූ. 3, පර්. 4.98) විශාල ඉඩම් කොටස සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1317 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 1145/203 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙලිගල් සහ පරණකුරු කෝරලේ කඳුඅග පත්තුවේ දකුණු කඩුපිට පත්තුව ලහුපට සහ හාල්මැස්ස ග්‍රාමයේ පිහිටි හුණුගල එස්ටේට් යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. එල්.

ආර්. වීරසිංහ යන අය විසින් සාදන ලද 2004 නොවැම්බර් 19 දාතම හා අංක 666 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගුරුගොඩ ඔය, නැගෙනහිරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත, දකුණට : ප්‍රධාන පාර සහ බස්නාහිරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 6.73) විශාල ඉඩම් කොටස සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 666 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 1179/167 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

4. එකී ලහුපන සහ හාල්මැස්ස ග්‍රාමයේ පිහිටි හුණුගල එස්ටේට් යයි කියනු ලබන ඉඩමට අංක 666 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත නැගෙනහිරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත සහ ගම්සභා පාර, දකුණට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත, බස්නාහිරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත සහ දොල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 16.74) විශාල ඉඩම් කොටස සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 666 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 1179/168 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

5. එකී ලහුපන සහ හාල්මැස්ස ග්‍රාමයේ පිහිටි හුණුගල එස්ටේට් යයි කියනු ලබන ඉඩමට අංක 666 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත නැගෙනහිරට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත සහ කෑගල්ල ප්ලාන්ටේෂන් කොම්පැණි, දකුණට : ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගලවත්ත සහ බස්නාහිරට : එම්. ආර්. ජේ. හසන් සහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයිති හුණුගල වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම නමයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 32.90) විශාල ඉඩම් කොටස සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 666 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 1179/169 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

6. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පරණකුරු කෝරළේ, කඳවහ පත්තුවේ ඇලගල්ල සහ හුණුගල ග්‍රාමසේවක කොට්ඨාශයේ, පිහිටි හුණුගල කොට්ඨාසයේ සහ වවුලතැන්න කොට්ඨාසයේ පරම්බේ එස්ටේට් යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. ආර්. ටී. කේ. හේරත් යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 12 දාතම හා අංක 2560 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1989 දරන කුඹුරේ කොටසක් සහ පාර, නැගෙනහිරට : අංක 1989 දරන කුඹුරේ කොටසක් සහ පාර, දකුණට : අංක 1989 දරන කුඹුරේ කොටස් සහ බස්නාහිරට : පුද්ගලික ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හතයි දශම නමයයි පහක් (අ. 0, රූ. 2, පර්. 7.95) හෝ හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි දෙකයි දෙකයි හතරයි හතරයි පහක් (හෙක්. 0.222445) විශාල ඉඩම් කොටස සමග එකී අංක 2560 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 573/14 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

7. එකී හුණුගල කොට්ඨාසයේ සහ වවුලතැන්න කොට්ඨාසයේ පරම්බේ එස්ටේට් යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. ආර්. ටී. කේ. හේරත් යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 12 දාතම හා අංක 2560 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම උප බදුකර අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1989 දරන කුඹුරේ කොටසක් සහ ගුරුගොඩ ඔය, නැගෙනහිරට : ලොට් 5 දකුණට : පාර සහ අංක 1989 දරන කුඹුරේ කොටසක් සහ බස්නාහිරට : පාර සහ අංක 1989 දරන කුඹුරේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසි නමයයි දශම බිංදුවයි පහක් (අ. 0, රූ. 1, පර්. 29.05) හෝ හෙක්ටයාර බිංදුවයි දශම එකයි හතයි හතරයි හයයි හතරයි හතක් (හෙක්. 0.174647) විශාල ඉඩම් කොටස සමග එකී අංක 2560 දරන පිඹුරට අනුව වෙළුම /පත්ඉරුව ඒ 573/15 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

8. එකී හුණුගල කොට්ඨාසයේ සහ වවුලතැන්න කොට්ඨාසයේ පරම්බේ එස්ටේට් යයි කියනු ලබන ඉඩමට අංක 2560 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියළුම උපබදුකර අයිතීන් ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 නැගෙනහිරට : ලොට් 4, දකුණට : ගුරුගොඩ ඔය සහ බස්නාහිරට : ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනයි දශම බිංදුවයි (අ. 0, රූ. 1, පර්. 3.0) හෝ හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි පහයි අටයි අටක් (0.007588 හෙක්.) විශාල ඉඩම් කොටස සමහ එකී අංක 2560 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 573/16 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

9. පහත සඳහන් දෑ ඇතුළු සියළුම නිශ්චල යන්ත්‍රාගාර යන්ත්‍රෝපකරණ වැද්දුම් සහ සවිකිරීම් :

| අංක | උපකරණ | අංක | පිරිවිතර | වර්ගය | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|---|
| 1 | 36 කේවී, හයි වෝල්ටේජ් මීටරින් ඇන්ඩ් රොටෙක්ෂන් පැනල් (36kv, High voltage metering & rotection Panel) | 1 | 8 BT1 | Siemens | තුර්කිය |
| 2 | 3 කේවී, මීඩියම් වෝල්ටේජ් මීටරින්, ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් සින්ක්‍රොනයිසින් පැනල්) (3kv, medium voltage metering, protection & synchronizing panel) | 2 | 8 BT1 | Siemens | තුර්කිය |
| 3 | බැටරි චාජ් (Battery Charge) | 1 | 24v, 150 AH | Aees | ප්‍රංශය |

| *අංක* | *උපකරණ* | *අංක* | *පිරිවිතර* | *වර්ගය* | *නිෂ්පාදිත රට* |
|---|---|---|---|---|---|
| 4 | ට්‍රාන්ස්ෆෝමර්ස් (Transformer) 3150 KVA) | 2 | 3150kVA, 3/33kV | LTL | ශ්‍රී ලංකාව |
| 5 | ට්‍රාන්ස්ෆෝමර් (Transformers 80 KVA) | 1 | 80kVA, 0.4/33kV | LTL | ශ්‍රී ලංකාව |
| 6 | 3KV ජෙනරේටර් # 1සෙන්ට්‍රල් කන්ට්‍රෝල් පැනල් (3KV- Generator #1 Central Control Panel) | 1 | | දේශීයව නිෂ්පාදනය කරන ලදී. | |
| 7 | 3 KV ජෙනරේටර් #1 සෙන්ට්‍රල් කන්ට්‍රෝල් පැනල් (3KV- Generator #2 Central Control Panel) | 1 | | දේශීයව නිෂ්පාදනය කරන ලදී. | |
| 8 | 33kV, HV සෙන්ට්‍රල් කන්ට්‍රෝල් පැනල් (33kV, HV Central Control Panel) | 1 | | දේශීයව නිෂ්පාදනය කරන ලදී. | |
| 9 | ෆ්‍රැන්සිස් ටර්බයින්ස් (Francis turbines) | 2 | 3000 KW,rated for 4.2m3/s@66 meters head | Gugler | ඔස්ට්‍රියාව |
| 10 | හයිඩ්‍රොලික් ඒකක (Hydraulic Units) | 2 | | | |
| 11 | ලුබ්රිකේෂන් ඔයිල් සිස්ටම් (Lubrication oil system) | 2 | | Rockwell | පෝලන්තය |
| 12 | AVR සමග සින්ක්‍රොනස් ජෙනරේටර් (Synchronous generators with AVR) | 2 | 3000KVA, 750 rpm, 3kV | Dolmel | පෝලන්තය |
| 13 | බටර්ෆ්ලයි වැල්ව් (Butterfly Valves) | 2 | Gugler | | ඔස්ට්‍රියාව |
| 14 | ටර්බයින් කන්ට්‍රෝල් පැනල් (Turbine control Panel) | 1 | Gugler | | ඔස්ට්‍රියාව |
| 15 | ලෝ වෝල්ටේජ් පැනල් (Low voltage panel) | 1 | 400v | දේශීයව නිෂ්පාදනය කරන ලදී | |
| 16 | Y -බ්‍රාන්ච් පයිප් (Y-Branch Pipe) | 1 | | | |
| 17 | ගැන්ට්‍රි ක්‍රේන් (Gantry Crane) | 1 | | | |
| 18 | සංඥා රැහැන (Signal Cable) | 1 | | | |
| 19 | පවර් කේබලය (Power Cable) | 1 | | | |
| 20 | අර්තින් (Earthing) | 1 | | | |
| 21 | හදිසි ශල්‍යකර්ම මේසය (Emergency operating table) | 1 | | | |
| 22 | එලාර්ම් උපකරණය (Alarm Device) | 1 | | | |
| 23 | මීටර් 329 පෙන්ස්ටොක් පෙනිට්‍රේෂන් (329 meters of penstock penetration) | 1 | | | |
| 24 | හයි ටෙන්ෂන් ස්විච් ගියර් (High tension switch gear) | 1 | | | |
| 25 | ප්‍රධාන වැල්ව් එක (Main Valve) | 1 | | | |
| 26 | දුරස්ථ පාලකය (Remote Control) | 1 | | | |
| 27 | මීඩියම් වෝල්ටේජ් ක්‍යුබිකල් (Medium voltage Cubicle) | 1 | | | |
| 28 | ප්‍රධාන ට්‍රාන්ස්ෆෝමරය (main Transformer) | 2 | | | |
| 29 | අතිරේක ට්‍රාන්ස්ෆෝමරය (auxiliary Transformer) | 1 | | | |

මින්මතු සවිකරනු ලැබිය හැකි දැනට පවත්නා ඕනෑම යන්ත්‍රෝපකරණයක් වෙනුවට ස්ථිරව සවිකරනු ලැබිය හැකි සියලුම යන්ත්‍රෝපකරණ සහ මෙහි දෙවන උපලේඛනයේ විස්තර කොට ඇති නිශ්චල දේපළෙහි අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකනු ලබන සහ මින් මතුවට, ස්ථිරව මෙම ගොඩනැගිල්ලට සවිකරනු ලබන සහ මෙම ලේඛනයේ දැක්වෙන, හා කලින් කලට හා සියලුම කාලයන්හි දී ගෙනෙනු ලබන සියලු යන්ත්‍රෝපකරණ ඇතුළත් විය යතුය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

03-482/1

---

## ලංකා බැංකුව - මීගමුව කඩවීදිය ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2009.12.10 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 2007.10.05 දිනැති අංක 4946 දරන බැඳුම්කරය මත මුල් මුදල සහ 2009.10.27 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් තිස් දෙලක්ෂ අනූඅට දහස් දෙසිය විසි එකයි ශත පහක (රු. 32,98,221.05) මුදලක් සමඟ රුපියල් හයලක්ෂ අනූනවදහස් එකසිය හැටඅටයි ශත පනස් එකක (රු. 6,99,168.51) සහ රුපියල් දාහත් ලක්ෂ පනස් හය දහස් පන්සිය හතලිස් තුනයි ශත හැටතුනක (රු. 17,56,543.63) ණය මුදලක් මත වසරකට සියයට විසිපහයි දශම හතයි පහ (25.75%) බැගින් පොළියක් ද, 2009.10.28 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කටාන, දිසාගෙවත්ත, ඇතුමන්කඩ පාර, අංක 13/1ඒ හි සහ දෙමංහන්දිය, ග්‍රේස්ලන්ඩ් එස්ටේට් අංක 149/36 නව ලිපිනයෙහි පදිංචි කරනිලගේ ඉන්ද්‍රජිත් මෛත්‍රී සේනාධීර මහතා සහ රුවන්ති ප්‍රැන්සිකා රොද්‍රිගු මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 4946 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තිස් දෙලක්ෂ අනූ අට දහස් දෙසිය විසි එකයි ශත පහක (රු. 32,98,221.05) මුදල සමග 2009.10.28 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මීගමුව, ඩයස් ගුරුගේ බිල්ඩින්, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22 හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, මීගමුව කඩවීදිය ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### විකිණීමට ඇති දේපළ

#### ඉහත සඳහන් පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දූනගහපත්තුවේ, දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ල පිහිටි ''ග්‍රේස්ලන්ඩ් එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1992 නොවැම්බර් 07 දිනැති අංක 2789 දරන පිඹුරෙහි ලොට් 36 ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 36 උතුරට : ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන්කළ කොටස) සහ ලොට් 37 ද, නැගෙනහිරට ලොට් 37 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ලොට් 35 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 35 සහ ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන්කළ කොටස) ද, මායිම්ව අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතරයි දශම හතයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 14.70) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි දෙකක (හෙක්ටයාර් 0.0372) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගහකොළ සහ වෙනත් සියළු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 962/168 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොන්ඩෙගම්මුල්ලෙ හි පිහිටි ''ග්‍රේස්ලන්ඩ් එස්ටේට්'' නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 37 ලෙස දක්වා සීමා නිර්නය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 37 උතුරට : ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන්කළ කොටස) සහ ලොට් 38 ද, නැගෙනහිරට : ලොට් 38 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ලොට් 36 සහ ජයරත්න ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 36 සහ ලොට් 78 (අඩි 30 පළල පාරට වෙන්කළ කොටස) ද, මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතරයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 14.60) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හයයි නවයක (හෙක්ටයාර් 0.0369) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගහකොළ සහ වෙනත් සියලු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 962/169හි ලියාපදිංචි කර ඇත.

#### ඉහත සඳහන් දෙවන උපලේඛනය

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොණ්ඩෙගම්මුල්ල පිහිටි ''ග්‍රේස්ලන්ඩ් එස්ටේට්'' නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 78 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්නය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 78 උතුරට : ලොට් 51 සිට 55, 65,42 සිට 44 දක්වා ද, 13 සිට 17 දක්වා ද, 21 සිට 24 දක්වා ද, 79 (පාර) 80,81 සහ 82 (පාර) දක්වා ද, නැගෙනහිරට : ලොට් 47, 48, 29 සිට 43 දක්වා ද, 29 සිට 42 දක්වා සහ 82 (පාර) ද, දකුණට : ලොට් 48 සිට 50 දක්වා ද, 29 සිට 39 දක්වා ද, බස්නාහිරට : ලොට් 5 සිට 12 දක්වා ද, 20 සිට 24 දක්වා 80, 81 (පාර) සහ 27 ද, මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනයි, පර්චස් එකොලහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 3, පර්. 11.50) නැතහොත් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි තුනයි දෙකයි හයක (හෙක්ටයාර 0.3326) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 705/219 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොණ්ඩෙගම්මුල්ල පිහිටි ''ග්‍රේස්ලන්ඩ් එස්ටේට්'' නමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 79 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්නය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 55, 56, 59 සහ 84 ද,

නැගෙනහිරට : ඇල , ලොට් 55, 56, 59 සහ 77 ද, දකුණට : ලොට් 1 සිට 5 දක්වා සහ ලොට් 78 ද, බස්නාහිරට : ලොට් 1 සිට 5 දක්වා සහ ලොට් 78 ද, මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස්හතරක (අ. 0, රූ. 0, පර්. 34) නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි අටයි හයයි බිංදුවක (හෙක්ටයාර 0.0860) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 705/218 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොණ්ඩෙගම්මුල්ල පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නැමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 80 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 80 උතුරට : ලොට් 12,14,15,17 සහ 18 ද, නැගෙනහිරට : ලොට් 79 (පාර) ලොට් 13, 16, සහ 77 ද, දකුණට : ලොට් 79 (පාර) සහ ලොට් 13, 19 සහ 20 ද, බස්නාහිරට : ලොට් 14, 15 සහ 18 ද මායිම් ව එකි අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොලහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 12.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 705/238 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොණ්ඩෙගම්මුල්ල පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නැමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 81 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 24 සහ 25 ද, නැගෙනහිරට: ලොට් 79 (පාර) සහ 24 ද, දකුණට : ලොට් 26 සහ 27 ද, බස්නාහිරට: ලොට් 25 සහ 26 ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 2.80) නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි එකක ( හෙක්ටයාර 0.0071) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 705/239 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොණ්ඩෙගම්මුල්ල පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නැමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 82 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 82 උතුරට : ලොට් 46 සහ 47 ද, නැගෙනහිරට : ලොට් 46 ද, දකුණට : ලොට් 44 සහ 45 ද, බස්නාහිරට : ලොට් 79 පාර) ද මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් තුනයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 3.20) නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි අටයි එකක (හෙක්ටයාර 0.0081) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙයි මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 705/240 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට දෙමංහන්දිය සහ කොණ්ඩෙගම්මුල්ල පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නැමැති ඉඩමෙහි අංක 2789 දරන පිඹුරෙහි ලොට් 83 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 83 සහ උතුරට : 84 සහ ඇලද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 78 (පාර) ද, බස්නාහිරට: ලොට් 62 සහ 65 දක්වා ද, මායිම්ව එකී අංක 2789 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 9.40) නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි තුනයි අටක (හෙක්ටයාර 0.0238) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 705/241 හි ලියාපදිංචි කර ඇත.

ජී. එච්. එස්. ප්‍රනාන්දු,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව.
03-486

පීවී 3472.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "දේවානි ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.07.26 වැනි දින සංස්ථාපිත සමාගමක් වන දේවානි ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, දේවානි ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ක් වූ පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-447

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.05.25 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0170-02509486-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. පරමසෝදි විසින් සහතික කරන ලද 2007 මාර්තු මස 20 දිනැති අංක 2447 සහ 2449 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම හඟුරන්කෙත ලියාපදිංචි එන් (පීවීඑස්) 42726 යටතේ 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන සැග්රාස් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර

හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහයලක්ෂ විසිහයදහස් පන්සිය දොළහයි ශත අනූහතරක (රු. 26,26,512.94) මුදලක්, 2008 ජුනි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 26,26,512.94 මුදලද, 2008 සැප්තැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 2447 සහ 2449 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## 1 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගංදහය කෝරළේ දකුණ ආරාගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි 19, 20, 23, 24 සහ 25 වැනි දිනැති අංක ජේ 121 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිඩ්ලි මාච් එස්ටේට් නමැති ඉඩමේ ලොට් 95 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි මස 19, 20, 23 සහ 24 දිනැති අංක ජේ 106 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1, 2, 3, 4 සහ 5 අතුරු බෙදීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 98 ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ ලොට් 152 ද, දකුණට : මෙම සැලැස්මේ ලොට් 94 සහ සහ බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට් 96 සහ 97 ද යන මායිම් තුළ පෙර කී අංක ජේ 121 දරන සැලැස්ම අනුව පර්චස් දහහතයි දශම හයක් (අ. 0, රූ. 0. පර්. 17.6) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මධ්‍යම පළාතේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගංදහය කෝරළේ දකුණ ආරාගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි 19, 20, 23, 24 සහ 25 වැනි දිනැති අංක ජේ 121 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිඩ්ලි මාච් එස්ටේට් නමැති ඉඩමේ ලොට් 98 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි මස 19, 20, 23 සහ 24 දිනැති අංක ජේ 106 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1, 2, 3, 4 සහ 5 අතුරු බෙදීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 99 ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ ලොට් 152 ද, දකුණට : මෙම සැලැස්මේ ලොට් 95 සහ බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට් 97 ද යන මායිම් තුළ පෙර කී අංක ජේ 121 දරන සැලැස්ම අනුව පර්චස් දහනවයයි දශම අටක් (අ. 0, රූ. 0. පර්. 19.8) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී විකුණුම්කරුගේ සහ සිය පෙර කියන ලද සහ හෝ සිය කුලීකරුවන්ගේ, සේවකයින්ගේ, කම්කරුවන්ගේ, ආගන්තුකයන්ගේ සහ සමාන අයිතිවාසිකම් ඇති සියලු අන් අයගේ හෝ ඔවුන් විසින් බලය දෙනු ලබන අයගේ පූර්ණ සහ නිදහස් අයිතිය, නිදහස, අවසරය සහ බලපත්‍රය ඇතිව පහත විස්තර කරනු ලබන මාර්ග දිගේ සහ උඩින් බර පැටවූ හෝ නොපැටවු වාහන ඇතිව හෝ නැතිව යාමට, පසුකර යාමට සහ නැවත යාමට සහ ඉහත විස්තර කරනු ලබන එකී පරිශ්‍රයන්හි සාමකාමී බුකිත්ය හා සම්බන්ධ සියලු කාරණා සඳහා එකී ගැණුම්කරුන්ගේ සහ ඔහුගේ පෙර කියන ලද අයගේ ප්‍රයෝජනය සහ සුබ සිද්ධිය සඳහා එකී මාර්ග දිගේ සහ උඩින් මුදල් ගෙවා ජල බස්නාක්‍රම, සහ විදුලි කේබල් සහ උඩු රැහැන් සහ වෙනත් අත්‍යවශ්‍ය උපක්‍රම යෙදීමට නමුත් එකී අයිතිවාසිකම් යම්කිසි ආකාරයකින් හෝ ක්‍රමයකින් එවැනි සමාන අයිතිවාසිකම් හිමි වෙනත් අයගේ අයිතින්ට බාධා නොවන අයුරු විය යුත්තේ ය.

මධ්‍යම පළාතේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගංදහය කෝරළේ දකුණ ආරාගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි 19, 20, 23, 24 සහ 25 වැනි දිනැති අංක ජේ 121 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිඩ්ලි මාච් එස්ටේට් නමැති ඉඩමේ ලොට් 152 ලකුණු කළ (ප්‍රවේශ මාර්ගය) (බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි මස 19, 20, 23 සහ 24 දිනැති අංක ජේ 106 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1, 2, 3, 4 සහ 5 අතුරු බෙදීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 9, 10, 11, 12, 13, 39, 40, 41, 42. 43, 44, 104 14 ද, නැගෙනහිරට : හරාගම එස්ටේට් (රජයේ) මෙම සැලැස්මේ ලොට්ස් 15, 19, 151, 25. 26, 157, 37, 38, 39 සහ 148 ද, දකුණට : මෙම සැලැස්මේ ලොට්ස් 76, 78, 79, 84, 147, 85, 86, 89, 156, 90, 93, 14, 104 බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට්ස් 93, 94, 95, 98, 99, 100, 155, 102, 103, 14 සහ 104 සහ මහවැලි රජ මාවත ද යන මායිම් තුළ පෙර කී අංක ජේ 121 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් විසිඑකයි දශම හයක් (අ. 0, රූ. 2, පර්. 21.6) නොහොත් හෙක්ටයාර් 0.25705 විශාල ඉඩම.

මධ්‍යම පළාතේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගංදහය කෝරළේ, දකුණ ආරාගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි 19, 20. 23, 24 සහ 25 වැනි දිනැති අංක ජේ 121 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිඩ්ලි මාච් එස්ටේට් නමැති ඉඩමේ ලොට් 147 ලකුණු කළ (ප්‍රවේශ මාර්ගය) (බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1997 මැයි මස 19, 20, 23 සහ 24 වැනි දිනැති අංක ජේ 106 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1, 2, 3, 4 සහ 5 අතුරු බෙදීමක් වන) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට්ස් 85 සහ 148 ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ ලොට්ස් 84. 83, සහ 82 ද, දකුණට : පාර ද සහ බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට්ස් 87 සහ 85 සහ මහවැවිලි රජ මාවත ද යන මායිම් තුළ පෙර කී අංක ජේ 121 දරන සැලැස්ම අනුව පර්චස් දහහතයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 17.4) නොහොත් හෙක්ටයාර් 0.04400 විශාල ඉඩම.

## 2 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු කොට්ඨාසයේ, පල්ලේසිය පත්තුවේ කන්දේපල්ලේ කෝරළේ, වගපනහ ඇතාබැඳිවැව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. දිසානායක විසින් සාදන ලද 2002.09.22 දිනැති අංක 7017 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගුරුමදැහැන්යාය නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 7017 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : සයිමන් සහ ගුණසේකර හිමිකම් කියනු ලබන වෙලබිම්යාය ද, දකුණට : අංක 4120 දරන සැලැස්මේ සඳහන් ලොට් 5 සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-505

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බියගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පයාගල හෙට්ටිආරච්චිගේ සරත්.

2009.12.02 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2006.10.17 වැනි දින සහ අංක 24354 දරන බැඳුම්කරය යටතේ (පහත පළමුවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් දහනමලක්ෂ අසූදෙදහස් නමසිය විසිපහයි ශත පනහ (රු.1,982,925.50) ක මුදලක් 2009.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට ගෙවීම සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2006.12.22 වැනි දින සහ අංක 24559 දරන බැඳුම්කරය යටතේ (පහත දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) සහ අංක 24558 දරන බැඳුම්කරය යටතේ (පහත තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් දහහත්ලක්ෂ අසූදෙදහස් පන්සිය තිස්හයයි ශත අනූහය (රු. 1,782,536.92) ක මුදලක් 2006.12.22 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට ගෙවීම පයාගල හෙට්ටිආරච්චිගේ සරත් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්හත්ලක්ෂ හැටපන්දහස් හාරසිය හැටදෙකයි ශත හතළිස්හය (රු.3,765,462.46) ක මුළු මුදලක් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,765,462.46 ක මුදලට 2009.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 12243, 13186 සහ 24354, 24559, 24558 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

ඌව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අතුල්ගම කෝරලේ, අපලපිටියේ, ගොඩකුරහන්වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. පී. ජයලත් කුමාර විසින් මැන සාදන ලද 2001.07.30 දින සහ 962 දරන පිඹුරේ ලොට් අංක 2 දරන ඉඩමේ උතුරට : ලොට් අංක 1 න් ද, නැගෙනහිරට : මහ කුඹුරෙන් ද, දකුණට : ලොට් අංක 3 න් සහ ගුරුගාල්ල-අවිස්සාවේල්ල ප්‍රධාන පාරෙන් ද සහ බස්නාහිරට : ගුරුගාල්ල-අවිස්සාවෙල්ල ප්‍රධාන පාරේන් ද, මායිම් වූ පර්චස් දහනමයයි දශම නමය (අ. 0, රූ. 0, පර්. 19.9) ක් විශාලත්වය ඇති ඉඩම ගොඩනැගිලි ගහකොළ සහ සියළුදේත් සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 134/179 වෙළුමේ/පත්‍ර්ගුරුව යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අදිකාරි පත්තුවේ, මාකොළ උතුර, මිල්ලගහවත්ත හොරගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක වී.එෆ්.ජේ. පෙරේරා විසින් මැන සාදන ලද 1977.10.25 දින සහ 6506 දරන පිඹුරේ ලොට් අංක 3 දරන කොටසේ උතුරට ලොට් අංක 75ත් ද, නැගෙනහිරට : සී. ඩී. එම්. වික්‍රමතුංගට අයිති ඉඩමෙන් ද, දකුණට : ලොට් අංක 4න් ද සහ බස්නාහිරට : ලොට් අංක 2 සහ 5න් ද මායිම් වූ පර්චස් විසිදෙකයි දශම පහක (අ. 0. රූ. 0, පර්. 22.5) විශාලත්වය ඇති ඉඩම ගොඩනැගිලි, ගහකොළ සහ සියළුදේත් සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 384/145 වෙළුමේ/පත්‍රිගුරුව යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, උග්ගල්බඩ, දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. ඒ. එන්. පී. රණසිංහ විසින් මැන සාදන ලද 1997.09.22 දින සහ 80/97 දරන පිඹුරේ ලොට් අංක 4 දරන කොටසේ උතුරට : ලොට් අංක 3 න් සහ රණවීරට අයිති බංගලාවත්තෙන් ද, නැගෙනහිරට : රණවීරට අයිති බංගලාවත්තෙන් ද, දකුණට : ලොට් අංක 5 න් සහ රණවීරට අයිති බංගලාවත්තෙන්ද සහ බස්නාහිරට : ලොට් අංක 3 සහ 5 න් ද මායිම් වූ පර්චස් විසිපහයි දශම අට (අ. 0, රූ. 0, පර්. 26.8) ක් විශාලත්වය ඇති ඉඩම ගොඩනැගිලි ගහකොළ සහ සියළු දේත් සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 215/266 වෙළුම/පත්‍රිගුරුව යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 80/97 හි ලොට් අංක 5 ලෙස නිරූපිත කොටසේ සඳහන් මාර්ග අයිතියද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-470/3

---

## සම්පත් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

තුඩුගල ග්‍රැෆික්ස් ඇන්ඩ් ප්‍රින්ටර්ස්.
ගිණුම් අංකය : 0005 1001 1082.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික ලද 2002 ඔක්තෝබර් මස 18 දාතම හා අංක 663 සහ 2004 ඔක්තෝබර් මස 22 දාතම හා අංක 1826 දරන බැඳුම්කර දෙක හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. ගම්ලත් යන අය විසින් ලියා සහතික කරන ලද 2005 අප්‍රේල් 20 දාතම හා අංක 830ඒ දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තුඩුගල ග්‍රැෆික්ස් ඇන්ඩ් ප්‍රින්ටර්ස් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ එකී ජනරජයේ කැළණිය, පෙතියාගොඩ, බියගම පාර, අංක 1/20හි කරගෙන යන ව්‍යාපාරයේ හවුල්කරුවන් වන කැළණිය, පෙතියාගොඩ, බියගම පාර, අංක 1/20හි පදිංචි තුඩුගල මුදලිගේ අනුර චන්ද්‍රලාල් සහ වීරවර්ණ කුරුකුලසූරිය බූසබදුගේ චන්ද්‍රානි ප්‍රනාන්දු යන දෙදෙනා බන්ධදායීන් වශයෙන් හා එකී කැළණිය, පෙතියාගොඩ, බියගම පාර, අංක 1/20හි පදිංචි තුඩුගල මුදලිගේ අනුර චන්ද්‍රාලාල් උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස්නම ලක්ෂ හැට පන්දහස් හයසිය විසිඅටයි ශත විසිඑකක (රු. 39,65,628.21) මුදලක් 2006 අගෝස්තු මස 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්නම ලක්ෂ හැට පන්දහස් හයසිය විසිඅටයි ශත විසිඑකක (රු. 39,65,628.21) මුදලද 2006 අගෝස්තු 15 දින සිට අංක 663, 1826 සහ 830ඒ දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස්තුන් ලක්ෂ අනූ දහසක (රු. 33,90,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) හා තවත් රුපියල් පන්ලක්ෂක (රු. 5,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දාහතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 663, 1826 සහ 830ඒ දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ (දැන් ගම්පහ) දිස්ත්‍රික්කයේ, පැලියගොඩ නගර සභා සීමාවන් තුළ පැලියගොඩ ග්‍රාමයේ බියගම පාරේ පිහිටි වරිපනම් අංක 215 දරන "අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. නඩරාජා යන අය විසින් සාදන ලද 1994 ජුනි මස 25 දාතම හා අංක 2089 දරන පිඹුරේ නිරූපිත 1998 ජුනි දින දරන උප බෙදුම් පිටසන පරිදි බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1සී3ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1සී1 සහ 1සී2 නැගෙනහිරට : ලොට් 1සී2, දකුණට : ලොට් 1සී3බී සහ බස්නාහිරට : පී. සී. පෙරේරාගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.80) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2089 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 897/239 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පැලියගොඩ ග්‍රාමයේ බියගම පාරේ පිහිටි "අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩම බලයලත් මානක තැන කේ. නඩරාජා යන අය විසින් සාදන ලද 1994 ජුනි මස 25 දාතම හා අංක 2089 දරන පිඹුරේ නිරූපිත 1998 ජුනි දින දරන උප බෙදුම් පිටසන පරිදි බෙදා වෙන් කොට සීමා නිර්ණය කෙට ලොට් 1සී3බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, අතුරට : ලොට් 1සී3, නැගෙනහිරට : ලොට් 1සී2, දකුණට : බියගම පාර සහ බස්නාහිරට : පී. සී. පෙරේරාගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම තුනයි බිංදුවක් (අ. 0. රූ. 0. පර්. 4.30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර් අයිතීන්ද, වෙනත් අයිතීන්ද. වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2089 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 897/240 යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2089 දරන පිඹුරේ නිරූපිත ලොට් 1සී2 මතින් හා ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-481/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.